# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,586 - 2009 ජනවාරි මස 23 වැනි සිකුරාදා - 2009.01.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 110 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | — |
| ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... ... | 112 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 115 |
| විවිධ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා භාරගන්නා සියළුම දැන්වීම් *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2009 ජනවාරි මස 30 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2009 ජනවාරි මස 16 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපැලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන"**
රජයේ මුද්‍රණාලයාධිපති.

2009 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# බඩු බාහිරාදිය විකිණීම්

**මහෙස්ත්‍රාත් අධිකරණය - නුගේගොඩ**

වෙන්දේසිය - 2009

නුගේගොඩ මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු භාණ්ඩ වශයෙන් ඇති රාජසන්තක කරන ලද හා මෙතෙක් හිමිකම් පෑමක් නොකළ පහත සඳහන් භාණ්ඩ 2009.02.07 වැනි දින පෙ. ව. 9.30 ට අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මෙහි පහත සඳහන් කිසියම් භාණ්ඩයක් සඳහා හිමිකම් පාන්නෙකු වේ නම් වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය අයිතිවාසිකම් ඉදිරිපත් කළ යුතුය.

රෙජිස්ට්‍රාර්වරියගේ අවසරය මත එදින පෙ. ව. 9.00 සිට පෙ. ව. 9.30 දක්වා භාණ්ඩ පරීක්ෂා කළ හැකිය.

අධිකරණය විසින් නියම කරනු ලබන ලංසුව නොපිළිගැනෙන අවස්ථාවන්හිදී අධිකරණ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ සම්පූර්ණ අයිතිය අධිකරණය සතුව පවතී.

වෙන්දේසියේ දී මිළ දී ගනු ලබන භාණ්ඩ සඳහා එවලේ ම මුදල් ගෙවා එකී භාණ්ඩ අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු අතර, චෙක්පත් ආදිය භාරගනු නොලැබේ.

භාණ්ඩ ගැණුම්කරු ඔහුගේ ජාතික හැඳුනුම්පත රැගෙන ආ යුතුය.

වසන්ත ජිනදාස,
මහෙස්ත්‍රාත්,
නුගේගොඩ.

2009 ජනවාරි මස 06 වැනි දින,
නුගේගොඩ මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**උපලේඛනය**

| අනු අංකය | නඩු අංකය | විස්තරය | |
|---|---|---|---|
| 01. | B/523/00 | මුදු | 01 |
| 02. | B/780/00 | පෙන්ඩන්ට් | 01 |
| 03. | B/872/00 | චේන් | 01 |
| 04. | B/2846/00 | චේන් | 01 |
| 05. | B/346/02 | කරාබු ජෝඩු | 01 |
| 06. | B/321/04 | චේන් | 01 |
| | | වළලු | 02 |
| | | බ්‍රෙස්ලට් | 01 |
| 07. | B/1071/06 | පංචායුධ | 01 |
| 08. | 61207 | චේන් | 01 |
| 09. | AR/1034/01 | මුදු | 01 |
| 10. | AR/1035/01 | චේන් | 01 |
| 11. | AR/1035/01 | පෙන්ඩන්ට් | 01 |
| 12. | AR/1039/01 | රන් කැබලි | 01 |
| 13. | AR/1039/01 | රන් කැබලි | 01 |
| 14. | AR/1041/01 | පෙන්ඩන්ට් | 01 |
| 15. | AR/1042/01 | කරමාල | 01 |
| | | පෙන්ඩන්ට් | 01 |
| 16. | AR/1052/01 | කරාබු ජෝඩු | 01 |
| | | මුදු | 01 |
| | | ගල් සහිත මුදු | 01 |
| 17. | AR/1053/01 | බ්‍රෙස්ලට් | 01 |
| | | මුදු | 02 |
| 18. | AR/1053/01 | පෙන්ඩන්ට් | 01 |
| 19. | AR/1054/01 | බ්‍රෙස්ලට් | 01 |
| 20. | AR/1054/01 | චේන් | 01 |
| 21. | AR/1443/01 | මුදු | 01 |
| 22. | AR/998/02 | පෙන්ඩන්ට් | 01 |
| 23. | AR/46/03 | වළලු | 01 |
| 24. | AR/47/03 | චේන් | 01 |
| 25. | AR/48/03 | චේන් | 01 |
| 26. | AR/49/03 | වළලු | 01 |
| 27. | AR/51/03 | බ්‍රෙස්ලට් | 01 |
| 28. | AR/52/03 | මුදු | 01 |
| 29. | AR/53/03 | පවුමක කාසි | 01 |
| 30. | AR/54/03 | වළලු | 02 |
| 31. | AR/172/03 | මුදු | 01 |
| | | පංචායුධ | 01 |
| 32. | AR/173/03 | චේන් | 01 |
| 33. | AR/174/03 | මුදු | 01 |
| 34. | AR/176/03 | රන් කැබැලි | 01 |
| 35. | AR/940/03 | පෙන්ඩන්ට් | 01 |
| 36. | AR/1105/03 | කරාබු ජෝඩු | 01 |
| 37. | AR/562/05 | චේන් | 01 |
| 38. | AR/976/05 | පෙන්ඩන්ට් | 01 |
| | | කරාබු ජෝඩු | 01 |
| 39. | AR/976/05 | මුදු | 01 |
| | | කරාබු ජෝඩු | 01 |
| 40. | AR/976/05 | කරාබු ජෝඩු | 01 |
| 41. | AR/976/05 | පෙන්ඩන්ට් | 01 |
| 42. | AR/976/05 | මුදු | 01 |
| | | කරාබු ජෝඩු | 01 |
| 43. | AR/976/05 | මුදු | 01 |
| 44. | AR/977/05 | පෙන්ඩන්ට් | 01 |
| 45. | AR/984/05 | චේන් කැබලි | 01 |
| 46. | AR/984/05 | චේන් | 01 |
| 47. | AR/984/05 | මුදු | 01 |
| 48. | AR/984/05 | කුඩා රන් කැබැලි | 04 |
| 49. | AR/985/05 | චේන් කැබලි | 01 |
| 50. | AR/985/05 | චේන් කැබලි | 01 |
| 51. | AR/985/05 | චේන් | 01 |
| 52. | AR/1779/05 | පෙන්ඩන්ඩ් | 01 |
| 53. | AR/1034/06 | මුදු | 03 |
| 54. | AR/1039/06 | බ්‍රෙස්ලට් | 01 |
| 55. | AR/170/07 | බ්‍රෙස්ලට් | 01 |
| 56. | AR/65/02 | නැෂනල් ටී. වී. | 01 |
| 57. | AR/65/02 | ඇම්ප් | 01 |
| 58. | AR/1107/03 | සවල් | 01 |
| 59. | AR/970/05 | බ්ලෙන්ඩරයක කොටස් | |
| 60. | AR/1031/06 | ප්ලාස්ටික් බාල්දි | 01 |
| 61. | AR/1047/06 | ඇලුමිනියම් ඉනිමං | 01 |
| 62. | AR/10/07 | යකඩ බ්‍රේක් පොම්ප 01 (වාහන) | |
| 63. | AR/1855/08 | 01. නොකියා ජංගම දුරකථන | 03 |
| | | 02. මෝටරෝලා | 01 |
| | | 03. ගෑස් සිලින්ඩර් | 01 (shell) |

| අනු අංකය | නඩු අංකය | විස්තරය |
|---|---|---|
| | | 04. ගෑස් සිලින්ඩර් 01 (shell) |
| | | 05. කැසියෝ ඕගන් 01 |
| | | 06. ගෑස් ලිප් 01 |
| | | 07. නැෂනල් පැනසොනික් කැසට් 01 |
| | | 08. ඔර්ලෝසු 02 (ටේබල් ටොප්) |
| | | 09. ASK මල්ටි මීඩියා මාධ්‍ය උපකරණ 01 |
| | | 10. මැෂින් එකක උඩ කොටස |
| | | 11. PAS 2002 සඳහන් ඇම්ප් 01 |
| | | 12. DVD (LG) 01 |
| | | 13. Dialog සැටලයිට් රිසිවර් 01 |
| | | 14. විදුලි පංකා (Telesonic/Table) 01 |
| 64. | AR2358/08 | වතුර විදීමට ගන්නා බට 01<br>ඇතුලත කොටස් නැති CPU 02<br>මෝටර් 01 (කොටස්) |
| 65. | AR2357/08 | උදලු 04<br>අලවංගු 04<br>පොරව 01<br>අඩු මිටි 01<br>කුඩා මිටි 01 |
| 66. | AR51/07 | අත් ඔර්ලෝසු 14 (කාන්තා) |
| 67. | AR1036/06 | ජංගම දුරකථන(Motorolla 01/Nokia 01) |
| 68. | AR182/07 | ජංගම දුරකථන 01 (Nokia) |
| 69. | AR1783/05 | ජංගම දුරකථන 02 (Nokia) |
| 70. | AR107/07 | ජංගම දුරකථන 02 |
| 71. | 56236 (B1239/05) | ජංගම දුරකථන 05 |
| 72. | 61207 | ජංගම දුරකථන 01 (Motorolla) |
| 73. | 67036 | කමිස 04 |
| 74. | අංක රහිත | නැෂනල් ටී. වී. 01 |
| 75. | අංක රහිත | සන්යෝ කැසට් 01 |
| 76. | අංක රහිත | 1. තරාදි 01 (Normal)<br>2. තරාදි 01 (Budry/Dial)<br>3. තරාදි 01 (Budry/Dial)<br>4. තරාදි 01 (Budry/Dial)<br>5. තරාදි 01 (Salfer/Spring)<br>6. තරාදි 01 (Normal/Brass)<br>7. තරාදි 01 (Gram/dial)<br>8. තරාදි 01 (Five Goats)<br>9. තරාදි 01 (Dial)<br>10. තරාදි 01 (Ichiba/dial) |
| 77. | අංක රහිත | කුඩා ජැක් 01 (Hydranlic) |
| 78. | අංක රහිත | නූල් තොගයක් |
| 79. | අංක රහිත | ගෑස් ලිප් 01 |
| 80. | අංක රහිත | රෙගියුලේටර් සහිත ගෑස් ලිප් 01 |
| 81. | අංක රහිත | කැසිනෝ සූදුව සඳහා ගන්නා උපකරණ 01 |
| 82. | බී.480/06 | ටයර් (රිම් සහිත) 04 |
| 83. | බී 3493/04 | කාර් කැසට් 01<br>කාර් කැසට් 01 |
| 84. | 57533 | සිග්නල් ලයිට් 02 |
| 85. | අංක රහිත | ගුරුලෙකුගේ පිලිරුව 01 (දැව) |
| 86. | අංක රහිත | පැනසොනික් කැසට් යන්ත්‍ර 01 (AX-CS710) |
| 87. | 58088 | පිත්තල සෙම්බු 01<br>කුඩා පිත්තල පහන් 01<br>පිත්තල තාච්චි 01 |
| 88. | AR/183/07 | බෑග් 01 |

01-551

**මහෙස්ත්‍රාත් අධිකරණය - කෑගල්ල**

අධිකරණයට ඉදිරිපත් කරන ලද රාජසන්තක කරනු ලැබූ හා මෙතෙක් හිමිකම් නොකියන ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

01. කෑගල්ල මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාලව රාජසන්තක කරනු ලැබූ සහ මෙතෙක් හිමිකම් නොකියන ලද පහත සඳහන් භාණ්ඩ 2009.02.14 වැනි දින පෙරවරු 10.00ට මෙම අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි සඳහන් වන කිසියම් ද්‍රව්‍යයක් පිළිබඳව හිමිකම් දක්වන්නෙකු වේ නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දින වෙන්දේසිය ආරම්භ කිරීමට පැයකට කලින් ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතු ය.

03. රෙජිස්ට්‍රාර්වරියගේ අවසරය ලබා වෙන්දේසිය ආරම්භ කිරීමට පැය භාගයකට පෙර වෙන්දේසියට නියමිත භාණ්ඩයන් මහජනයාට පරීක්ෂා කර බැලිය හැකි ය.

04. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලංසුව නොපිළිගැනෙන අවස්ථාවන්හිදී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩයන් වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියෙන් මිළ දී ගනු ලබන භාණ්ඩයන් සඳහා එවෙලේම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතුය. සියලුම ගෙවීම් මුදලින් කළ යුතු අතර චෙක්පත් ආදිය භාරගනු නොලැබේ.

06. භාණ්ඩ මිළ දී ගනු ලබන සෑම අයෙකුම තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කිරීම අනිවාර්ය වන අතර මිළ දී ගන්නා භාණ්ඩ සියල්ල එදින පස්වරු 4.00 ට පෙර අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතුය.

රශ්මි සිංගප්පුලි,
මහෙස්ත්‍රාත් - කෑගල්ල.

2009 ජනවාරි මස 02 වැනි දින,
කෑගල්ල මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**උපලේඛනය**

| අනු අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|---|
| 01. | 19844/02 | 131-9657 යතුරු පැදිය |
| 02. | 65087/07 | SG HD - 4970 යතුරු පැදිය |
| 03. | 60414/06 | අත්ට්‍රැක්ටරයෙන් ගලවා ඇති එන්ජින් 01 යි |
| 04. | 67805/07 | අත්ට්‍රැක්ටරයෙන් ගලවා ඇති එන්ජින් 01 යි |
| 05. | 65973/07 | අත්ට්‍රැක්ටරයෙන් ගලවා ඇති එන්ජින් 01 යි |
| 06. | 57154/05 | අත්ට්‍රැක්ටරයෙන් ගලවා ඇති එන්ජින් 01 යි |
| 07. | 399/08 | අත්ට්‍රැක්ටරයකින් ගලවා ඇති එන්ජින් 01 යි |
| 08. | 2357/08 | ට්‍රේලරය සහිත අත්ට්‍රැක්ටර් 01 යි |
| 09. | 2480/08 | අත්ට්‍රැක්ටර් 01 යි<br>රවුම් කියත සහිත ඉරුම් බංකු 01 යි හැඩල් 01 යි |
| 10. | 2481/08 | රවුම් කියත සහිත ඉරුම් බංකු 01 යි |
| 11. | 4285/08 | ට්‍රේලරය සහිත අත්ට්‍රැක්ටර් 01 යි<br>රවුම් කියත සහිත ඉරුම් බංකු 01 යි |
| 12. | 5055/08 | රවුම් කියත සහිත ඉරුම් බංකු 01 යි |
| 13. | 4682/08 | රවුම් කියත සහිත ඉරුම් බංකු 01 යි |
| 14. | 3881/08 | රවුම් කියත සහිත ඉරුම් බංකු 01 යි |
| 15. | 1934/08 | රවුම් කියත සහිත ඉරුම් බංකු 01 යි |

| අනු අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|---|
| 16. | 4983/08 | රවුම් කියත් 01යි |
| 17. | 4984/08 | රවුම් කියත් 01යි |
| 18. | 46779/05 | වාහන අමතර කොටස් 06 යි |
| 19. | 57286/05 | වයර් රෝල් 06 යි |
| 20. | 38092/04 | කටුකම්බි රෝල් 02 යි |
| 21. | අංක රහිත | කටුකම්බි රෝල් 04 යි |
| 22. | 56686/05 | මුදල් දමන කැට 06 යි |
| 23. | 69447/07 | පැදුරු 01 යි |
| 24. | 12/08 | පැදුරු 01 යි |
| 25. | 872/08 | පැදුරු 01 යි, චිමිනි ලාම්පු 01 යි |
| 26. | 1367/08 | පැදුරු 0 1යි |
| 27. | 1610/08 | පැදුරු 01 යි |
| 28. | 724/08 | පැදුරු 01යි |
| 29. | 61294/06 | VCD යන්ත්‍ර 01 යි |
| 30. | 1250/08 | රබර් හෝස් 01 යි |
| 31. | 14092/01 | කටර් අඬු 01 යි |
| 32. | 64014/07 | ජංගම දුරකථන 02 යි, චාජර් 02 යි |
| 33. | 18253/02 | අත් ඔරලෝසු 03 යි, අත් ඔරලෝසු පටි 10 යි |
| 34. | 17047/02 | බිත්ති ඔරලෝසු 01 යි |
| 35. | 28758/03 | බෆල් 02 යි, කැසට් වැසි කොටසක් |
| 36. | ඒ 2476/02 | මේස විදුලි පංකා 01 යි |
| 37. | බී. 22032/02 | වාහන කැසට් යන්ත්‍ර 01 යි |
| 38. | 65328/07 | ග්‍රීස් පාර්සල් 01 යි |
| 39. | 22991/02 | අත් ශබ්දවිකාශන යන්ත්‍ර 01 යි<br>මෝටර් රෝලා යන්ත්‍ර 01 යි |
| 40. | 62466/06 | කවකටු පෙට්ටි 01 යි |
| 41. | 4879/08 | විදුලි හීටර් 01 යි |
| 42. | 4885/08 | තීන්ත ටින් 01 යි |
| 43. | 4728/08 | තීන්ත ටින් 01 යි |
| 44. | 3852/08 | ප්ලාස්ටික් කෑම පෙට්ටි 01 යි |
| 45. | 3851/08 | උනුවතුර බෝතල් 01 යි |
| 46. | 3849/08 | යතුරු තහඩු 01 යි |
| 47. | 60327/06 | ෆෝන් චාජර් 01 යි |
| 48. | 4883/08 | ෆෝන් චාජර් 01 යි |
| 49. | 3846/08 | ෆෝන් චාජර් 01 යි |
| 50. | 3848/08 | තුවා 01 යි |
| 51. | 4569/08 | තුවා 01 යි |
| 52. | 35960/03 | යකඩ බැරල් 08 යි |
| 53. | 3021/08 | යකඩ බැරල් 01 යි |
| 54. | 3481/08 | යකඩ බැරල් 01 යි |
| 55. | 3202/08 | යකඩ බැරල් 01 යි |
| 56. | 5047/08 | යකඩ බැරල් 01 යි |
| 57. | 3885/08 | යකඩ බැරල් 01 යි |
| 58. | 3153/08 | ඇලුමිනියම් මුට්ටි 01 යි<br>මැටි මුට්ටි 01 යි |
| 59. | 3883/08 | ඇලුමිනියම් මුට්ටි 02 යි |
| 60. | 3884/08 | ඇලුමිනියම් මුට්ටි 01 යි<br>මැටි මුට්ටි 01 යි |
| 61. | 3979/08 | ඇලුමිනියම් මුට්ටි 01 යි<br>මැටි කොරහ 01 යි |
| 62. | 3890/08 | ඇලුමිනියම් මුට්ටි 01 යි<br>මැටි මුට්ටි 01 යි |
| 63. | 3168/08 | ඇලුමිනියම් මුට්ටි 01යි<br>ඇලුමිනියම් සාස්පාන් 01 යි |
| 64. | 3169/08 | ඇලුමිනියම් මුට්ටි 01යි<br>මැටි මුට්ටි 01 යි |
| 65. | 3027/08 | ඇලුමිනියම් මුට්ටි 02 යි |
| 66. | 3170/08 | ඇලුමිනියම් මුට්ටි 01 යි<br>මැටි මුට්ටි 01 යි |
| 67. | 3270/08 | ඇලුමිනියම් මුට්ටි 01 යි<br>මැටි මුට්ටි 01 යි |
| 68. | 3447/08 | ඇලුමිනියම් මුට්ටි 01 යි<br>මැටි මුට්ටි 01 යි |
| 69. | 4675/08 | ඇලුමිනියම් මුට්ටි 01 යි<br>මැටි මුට්ටි 01 යි |
| 70. | 3106/08 | ඇලුමිනියම් මුට්ටි 01යි<br>මැටි මුට්ටි 01 යි |
| 71. | 3176/08 | වේවැල් කූඩා 01යි |
| 72. | 4592/08 | සවල් 02 යි |
| 73. | 4590/08 | සවල් 02 යි, බාල්දි 02 යි |
| 74. | 3654/08 | බාල්දි 01 යි |
| 75. | 3002/08 | බාල්දි 01 යි |
| 76. | 3151/08 | බාල්දි 01 යි |
| 77. | 4071/08 | බාල්දි 01 යි |
| 78. | 3773/08 | බාල්දි 01 යි |
| 79. | 4770/08 | බාල්දි 01 යි |
| 80. | අංක රහිත | හිස් වීදුරු බෝතල් 500 ක පමණ තොගයක් |
| 81. | අංක රහිත | හිස් ප්ලාස්ටික් කෑන් 30 ක පමණ තොගයක් |

01-630

# ආණ්ඩුවේ නොවන දැන්වීම්

## ප්‍රසිද්ධ නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනත ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම : ට්‍රාන්සිස්ටම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : 62948
ලියාපදිංචි ලිපිනය : අංක 149/5 1 වන මහල, හැව්ලොක් පාර, කොළඹ 05.

යූ. එච්. එම්. ගුණසේකර,
අධ්‍යක්ෂ.

01-647

## 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සංස්ථාපනය කිරීමේ ප්‍රසිද්ධ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ වගන්ති 9 (1) ට අනුව සමාගමේ ලියාපදිංචි අංකය හා ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය දක්වන ප්‍රසිද්ධ දැන්වීම

සමාගමේ නම : ෂෆාරි හෝල්ඩිංග්ස් (පෞද්ගලික) සමාගම
සමාගමේ ලියාපදිංචි අංකය : පී.වී. 66363
සංස්ථාපනය කළ දිනය : 2008.11.28
සමාගම ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 90, අනුරාධපුර පාර, පුත්තලම.

ඒ. එම්. ජවාමිල්,
සමාගමේ ලේකම්.

දුරකථන අංකය : 0777259884.

01-649

**2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සංස්ථාපනය කිරීමේ ප්‍රසිද්ධ දැන්වීම**

2007 අංක 07 දරන සමාගම් පනතේ වගන්ති 9(1) ට අනුව සමාගමේ ලියාපදිංචි අංකය හා ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය දන්වන ප්‍රසිද්ධ දැන්වීම :

සමාගමේ නම : හස්සස් fපර්නිචර් (පෞද්ගලික) සමාගම
සමාගමේ ලියාපදිංචි අංකය : පී/වී 66026
සංස්ථාපනය කළ දිනය : 2008.10.30
සමාගම ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 29/10, 4 වැනි පටුමග, අනුරාධපුර පාර, පුත්තලම.

ඒ. එම්. ජවාමිල්,
සමාගමේ ලේකම්.

දුරකථන අංකය : 0777-259884.

01-648

---

**සංස්ථාපිත නිවේදනය**

2007 අංක 07 දරන සමාගම් පනතේ වගන්ති 9(1) වගන්තිය යටතේ කරනු ලබන ප්‍රසිද්ධ නිවේදනය

පහත නම, ලියාපදිංචි අංකය සහ සමාගමේ ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය දක්වා ඇති සමාගම, සමාගම් පනතේ 34 වගන්තිය ප්‍රකාරව එකී නමට සීමාසහිත යන පදය ඇතුළත් නොකොට සීමාසහිත සමාගමක් වශයෙන් ශ්‍රී ලංකාව තුළ සමාගම් පනත යටතේ වර්ෂ 2008ක් වූ නොවැම්බර් මස 14 වැනි දින ලියාපදිංචි කරන ලදී :

සමාගමේ නම : වෙනුර එඩියුකේෂනල් මැනේජ්මන්ට් කන්සල්ටන්ට්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වී. 66199
සමාගමේ ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 11, අන්දරවත්ත පාර, පොල්හේන්ගොඩ, කොළඹ 05.

01-538/1

---

**සංස්ථාපිත නිවේදනය**

2007 අංක 07 දරන සමාගම් පනතේ වගන්ති 9(1) වගන්තිය යටතේ කරනු ලබන ප්‍රසිද්ධ නිවේදනයයි. පහත නම, ලියාපදිංචි අංකය සහ සමාගමේ ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය දක්වා ඇති සමාගම, සමාගම් පනතේ 34 වගන්තිය ප්‍රකාරව එකී නමට සීමාසහිත යන පදය ඇතුළත් නොකොට සීමාසහිත සමාගමක් වශයෙන් ශ්‍රී ලංකාව තුළ සමාගම් පනත යටතේ වර්ෂ 2008ක් වූ නොවැම්බර් මස 06 වැනි දින ලියාපදිංචි කරන ලදී :

සමාගමේ නම : බණ්ඩාර ඇන්ඩ් සන්ස් කම්පැනි (ප්‍රයිවෙට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වී. 66110
සමාගමේ ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 27, සර් බාරොන් ජයතිලක මාවත, කොළඹ 01.

01-538/2

---

**දැන්වීමයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (2) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

සමාගමේ කලින් නම : ශාන්ති ලංකා ආයුර්වේද ඉන්ස්ටිටියුට් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 3558
සමාගමේ අලුත් නම : ශාන්ති ලංකා ආයුර්වේද හෙල්ත් රිසෝට් ඇන්ඩ් ඉන්ස්ටිටියුට් (ප්‍රයිවට්) ලිමිටඩ්
වෙනස් කළ දිනය : 2008.12.30
සමාගමේ ලියාපදිංචි කාර්යාලය : සමන්තැන්න, බලගොඩ, පොද්දල
දිනය : 2009.01.08.

ඩබ්ලිව්. ජී. රොබට් ද සිල්වා,
සමාගමේ ලේකම්.

01-621

---

**ඇටෝර්නි බලය අවලංගු කිරීම**

කුරුණෑගල තැපැල්, දකුණු රවුම් පාරේ, අංක 9/2 දරන ස්ථානයේ පදිංචි මාලනී බක්මීවැව විවාහයට පසු මාලනී රත්වත්ත වන මා විසින් කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් වසන්ත ධම්මික ගමආරච්චි මහතා විසින් අත්සන් සහතික කරන ලද 1998 මාර්තු මස 19 වැනි දින ලේඛන ගත කරනු ලැබ ඇති 1998 මාර්තු 06 දාතම අංක 2640 දරන ඇටෝර්නි බලපත්‍රය මත කුරුණෑගල, දකුණු රවුම් පාරේ, අංක 9 පදිංචි ආනන්ද බක්මීවැව යන අයට මවිසින් පවරන ලද බලතල මෙයින් අවලංගු කරන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත්, මහජනතාවටත් මෙයින් දැනුම් දෙනු ලැබේ.

එකී ආනන්ද බණ්ඩාර බක්මීවැව විසින් මින් ඉදිරියට මා වෙනුවෙන් සිදුකරනු ලබන කිසිදු ක්‍රියාවකට හෝ ගණුදෙනුවකට ම විසින් වග කියනු නොලැබේ.

මාලනී බක්මීවැව නොහොත් මාලනී රත්වත්ත.

2009 ජනවාරි මස 07 වැනි දින.

01-604

---

**පෞද්ගලික සමාගමක් ලියාපදිංචිය පිළිබඳ මහජන දැන්වීම**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තියේ විධිවිධාන අනුව කරනු ලබන දැන්වීම :

සමාගමේ නම : රන්ගි පැෂන් (පුද්ගලික) සමාගම
ලියාපදිංචි කළ දිනය : 2008 ඔක්තෝබර් මස 17 වැනි දින
ලියාපදිංචි අංකය : පීවී 65904
ලියාපදිංචි කාර්යාලය : අංක 427, නුවර පාර, බල්ලපාන, යටිටෝගොඩ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි.

2008 නොවැම්බර් මස 02 වැනි දින.

01-585

### සමාගමක නාමය වෙනස් කිරීම

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (2) කොටස යටතේ පහත සඳහන් සීමාසහිත සමාගම 2008 දෙසැම්බර් මස 16 වැනි දින සිට සිය සමාගමේ නාමය වෙනස්කර ඇති බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

සමාගමේ පෙර නාමය : මයින්ඩ්ස් එෆ්. සී. බී. (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය : පී. වී. 5505
ලියාපදිංචි කාර්යාලය : 32/1- 32/2, කාසල් මාවත, කොළඹ 8
සමාගමේ නව නාමය : මයින්ඩ්ස් ඇඩ්වර්ටයිසින් (ප්‍රයිවට්) ලිමිටඩ්.

එස්ජේ කෝපරේට් සර්විසස්
(පුද්ගලික) සමාගම,
සමාගම් ලේකම්වරුන්.

2009 ජනවාරි මස 07 වැනි දින,
4 වන මහල, අංක 2, කාසල් පටුමග,
කොළඹ 4.

01-582

---

### සමාගමක් සංස්ථාපනය කිරීමේ ප්‍රසිද්ධ දැන්වීම

වර්ෂ 2007 අංක 7 දරන සමාගම් ආඥාපනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව කරනු ලබන නිවේදනය :

සමාගමේ නම : අසාමා ඉංජිනියරිං සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී. වී. 66474
සංස්ථාපිත කළ දිනය : 2008.12.11
ලියාපදිංචි ලිපිනය : අංක 47/3, වීරමාවත, කලල්ගොඩ, පන්නිපිටිය.

අධ්‍යක්ෂවරු.

01-606

---

### ඇටර්නි බලය අවලංගු කිරීම/ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජාඇල, මාඑළිය අංක 990 බී දරන ස්ථානයේ පදිංචි ජයවර්ධන ජයසූරිය ඇල්සන් ක්ලැරන්ස් රංජිත් ප්‍රනාන්දු වන මම, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් විජිත කුමාරගේ මහතා විසින් වර්ෂ 2003ක් වූ නොවැම්බර් මස 27 වැනි දින සහතික කරන ලද අංක 1267 දරන ඇටර්නි බලපත්‍රය මගින් එකී ශ්‍රී ලංකා ජනරජයේ ජාඇල, මාඑළිය, අංක 990 බී දරන ස්ථානයේ පදිංචි ජයවර්ධන ජයසූරිය ජෝශප් ප්‍රනාන්දු නමැති අයට ලබා දුන් ඇටර්නි බලපත්‍රය මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කොට අවලංගු කරනු ලැබූ බව ශ්‍රී ලංකා රජයත්, සියලු මහජනතාවනුත්, අන් සියලු දෙනාත් මෙයින් දැන ගනිත්වා.

එකී ඇටර්නි බලපත්‍රයේ සඳහන් ඇටර්නි බලකරු විසින් මෙදිනෙන් පසු මා වෙනුවෙන් කරනු ලබන ක්‍රියාවන් හෝ ගනුදෙනු සම්බන්ධයෙන් මා විසින් කිසිදු වගකීමක් භාරගනු නොලබන බවද, සියලු දෙනාම මෙයින් දැන ගනිත්වා.

ජයවර්ධන ජයසූරිය ඇල්සන් ක්ලැරන්ස් රංජිත් ප්‍රනාන්දු.

01-553

### පරිවෘත කිරීමේ නියෝගය

2007 අංක 07 දරන සමාගම් පනත – සමාගමේ ලියාපදිංචි අංකය N (PVS) 24958

සමාගමේ නම : හිමාලි ට්‍රේඩ් සෙන්ටර් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 29 සී, කළුතර පාර, අගලවත්ත
උසාවිය : බස්නාහිර පළාතේ, වාණිජ මහාධිකරණය, කොළඹ (සිවිල්)
නඩු අංකය : 38/2007/ CO
නියෝගය දුන් දිනය : 2008 මාර්තු මස 07 වැනි දින
පෙත්සම ඉදිරිපත් කළ දිනය : 2007 දෙසැම්බර් මස 10 වැනි දින.

පී. ඊ. ඒ. ජයවික්‍රම සහ ජී. ජේ. ඩේවිඩ්,
හවුල් නිලභාරගැනුම්කරුවන් හා
ඇවරකරුවෝ.

SJMS ඇසෝසියේට්ස් බාරේ,
ප්‍රතිව්‍යුහගත කිරීම
හා ආයතනික අයකර ගැනීම්,
4 වන මහල,
අංක 2, කාසල් පටුමග,
කොළඹ 04.

01-552/1

---

### පරිවෘත කිරීමේ නියෝගය

2007 අංක 07 දරන සමාගම් පනතේ 346 (1) වගන්තිය යටතේ හවුල් නිලභාරගැණුම්කරුවන් හා ඇවරකරුවන්ගේ පත්වීමේ දැන්වීම
හිමාලි ට්‍රේඩ් සෙන්ටර් (ප්‍රයිවට්) ලිමිටඩ්
**සමාගමේ ලියාපදිංචි අංකය : N (PVS) 24958**

සමාගමේ නම : හිමාලි ට්‍රේඩ් සෙන්ටර් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 29 සී, කළුතර පාර, අගලවත්ත
උසාවිය : බස්නාහිර පළාතේ, වාණිජ මහාධිකරණය, කොළඹ (සිවිල්)
නඩු අංකය : 38/2007/CO
හවුල් නිලභාරගැණුම්කරුවන්
හා ඇවරකරුවන්ගේ නම් : පී. ඊ. ඒ. ජයවික්‍රම සහ ජී. ජේ. ඩේවිඩ්,
හවුල් නිලභාරගැනුම්කරුවන් හා
ඇවරකරුවෝ,
SJMS ඇසෝසියේට්ස් බාරේ,
ප්‍රතිව්‍යුහගත කිරීම හා ආයතනික අයකර ගැනීම්,
4 වන මහල,
අංක 2, කාසල් පටුමග,
කොළඹ 04.

පත්වීමේ දිනය : 2008 මාර්තු 07 වැනි දින.

01-552/2

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

## වයඹ සංවර්ධන බැංකුව

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, බිංගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කිනියම කෝරළයේ 410 මානෙලෙම්බුව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ මානෙලෙම්බුව නමැති ගමේ පිහිටා ඇති සර්වේ ජනරාල් විසින් සාදනු ලැබ ඔහු භාරයේ ඇති අංක 02 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි අංක 1381 දරන පිඹුරෙහි අංක 100 දරන බිම් කැබැල්ල,

විශාලත්වය : රූඩ් 03 පර්චස් 10.

වයඹ සංවර්ධන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් 2009.02.20 වැනි දින පෙ. ව. 11.00 ට දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වැඩි විස්තර සඳහා 2006.12.15 දින *රජයේ ගැසට් පත්‍රය* ද, 2007.04.24 දින 'තිනකරන්', 2007.04.25 දින 'දිනමිණ' සහ 'ද අයිලන්ඩ්' පුවත් පත්වල පළ කර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම.*- බෝවත්ත නගරයේ සිට වීරපොකුණ මාර්ගයේ කි. මී. 1ක් පමණ ගොස් කොහොඹගස් හන්දියෙන් දකුණු පැත්තේ ඇති වීරපොකුණ දක්වා දිවෙන මාර්ගයේ කි. මී. 7.5ක් ගමන් කර වීරපොකුණ හන්දියෙන් වීරපොකුණ මධ්‍ය මහා විද්‍යාලය පසු කරනවාත් සමගම දකුණත පැත්තට ඇති මානෙලෙම්බුව දක්වා දිවෙන මාර්ගයේ කි. මී. 5.5ක් පමණ ගමන් කර හමුවන මානෙලෙම්බුව පළමුවන හන්දියෙන් වම් අත පැත්තට හැරෙනවාත් සමගම (කොරගහපොකුණ දෙසට) එම මාර්ගයේ වම් අත පැත්තෙන් අදාළ දේපළට ප්‍රවේශ විය හැකිය.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය :

1. ගැණුම් මිලෙන් 25%ක්,
2. වෙන්දේසිකරුගේ කොමිස් ගාස්තු 2 1/2%ක්,
3. රජයට ගෙවිය යුතු බද්ද සඳහා 1%ක්,
4. වෙන්දේසියට වැය වූ අනෙකුත් ගාස්තු ද,
5. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි 75% ක මුදල වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත වයඹ සංවර්ධන බැංකුව, අංක 155, මීගමු පාර, කුරුණෑගල වෙත ගෙවිය යුතුය.

වැඩි විස්තර සඳහා විමසන්න: වයඹ සංවර්ධන බැංකුව, අංක 155, මීගමු පාර, කුරුණෑගල.

දුරකථන අංක : 037-227428, 037-227429, 037-2227567, 037-2231880.

ඩබ්. පී. සී. පෙරේරා,
බලයලත් වෙන්දේසිකරු හා උසාවි කොමසාරිස්.

අංක 22, ප්‍රනාන්දු මාවත,
මීගමුව.

01-611

## හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - තලංගම ශාඛාව
### (කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. පී. එම්. මොහොට්ටි විසින් සහතික කරන ලද්දාවූ ද, හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. නමට ලියන ලද්දාවූ ද, 2004.10.26 දින සහ අංක 2516 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ගම්බලගේ ජානක ආනන්ද ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින්, හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල්, සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියලුම මුදල්, අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපළ 2009.02.17 වැනි දින පෙ. ව. 11.00 ට ඇරඹෙන පරිදි දේපළ පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*පහත දැක්වෙන චංචල යන්ත්‍රෝපකරණ සහ උපකරණවල විස්තර :*

| *විස්තරය* | *නිෂ්පාදන/මාදිලිය* | *අනුක්‍රමික අංකය* |
|---|---|---|
| 1. කපන යන්ත්‍රය | හිඩ්ල්බර්ග් | 65512-2 |
| 2. මුද්‍රණ යන්ත්‍රය | හිඩ්ල්බර්ග් /KOR | 563/373-753 |

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, අංගොඩ කොටිකාවත්ත, අවිස්සාවේල්ල පාරේ, අංක 338/1, පිහිටි පරිශ්‍රය තුළ ඒ මත (මෙහි මින්මතු සියල්ල සාමූහිකව බන්ධනදායිගේ චංචල යන්ත්‍රෝපකරණ සහ උපකරණ ලෙස සඳහන් කරනු ලබන) සහ බන්ධනදායි විසින් දැන් මින්මතු යම් කාලයක හෝ කලින් කලට හෝ ඉහත කී දිස්ත්‍රික්කය තුළ ව්‍යාපාරය පවත්වාගෙන යනු ලබන හෝ මෙය බලාත්මකව පවතින අතර තුර බන්ධනදායින්ගේ චංචල යන්ත්‍රෝපකරණ සහ උපකරණ ගෙන ගොස් තබනු ලබන හෝ තබනු ලබන පරිශ්‍රයන්හි බන්ධනදායි විසින් මින්මතු යම් කාලයක හෝ කලින් කලට බන්ධනදායින්ගේ චංචල යන්ත්‍රෝපකරණ සහ උපකරණ ඉවත් කොට ගෙන ගොස් තබනු ලබන ස්ථානය හෝ ස්ථානයන්හි ඇති ද මෙහි මින්මතු සියල්ල ඒකරාශිව බන්ධනදායින්ගේ චංචල යන්ත්‍රෝපකරණ සහ උපකරණ ලෙස සටහන් කරනු ලබන මෙවලම් සහ බඩුබාහිරාදිය ද ඇතුලුව කවර ආකාරයක හෝ සෑම විස්තරයකට ම අයත් චංචල යන්ත්‍රෝපකරණ සහ උපකරණ වේ.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2007.10.05 දින දරන *රජයේ ගැසට් පත්‍රය* හා 2007.11.06 වැනි දින අයිලන්ඩ්, දිවයින සහ තිනකරන් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසියේ අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය :

1. ගැණුම් මිලෙන් සියයට දහය (10%)ක්,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එක (1%)ක් ද,
3. වෙන්දේසියේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහ (2.5%)ක් ද,
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදහක් (රු. 2,000)ක් ද,
5. ලිපිකරු හා සෝෂක ගාස්තු රුපියල් පන්සියය (රු. 500)ක් ද,

6. සියලුම ප්‍රචාරක වියදම්.

ගැනුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ගෙවිය යුතුය. දින 30ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති 10% අහිමි කිරීමට සහ දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා අදාළ ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු ප්‍රධාන කළමණාකරු (ණය අයකිරීම්), හැටන් නැෂනල් බැංකුව පීඑල්සී, අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10, දුරකථන අංකඃ 2661815, 2661816 ගෙන් ලබාගත හැක.

රංජිත එස්. මහානාම,
සාම විනිසුරු (මුළු දිවයිනටම),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු,
හා බලයලත් වෙන්දේසිකරු.

ආර්. එස්. එම්. ඔක්ෂන්ස්,
මහනාම ඩ්‍රයිව්,
අංක 474, පිටකෝට්ටේ,
කෝට්ටේ.

01-653/3

---

## පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ප්‍රසිද්ධ දේපළ වෙන්දේසිය

බැංකුවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව පහත දැක්වෙන දේපළ 2009 පෙබරවාරි මස 13 වැනි දින ප. ව. 2.30 ට දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභා සීමාව තුළ අංක 20/10, මහින්දාරාම පාර, ඇතුල් කෝට්ටේ, කෝට්ටේ පිහිටි තෙළඹුගහවත්ත සහ කෝන්ගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු පී. ෆිලික්ස් ඩයස් විසින් සාදන ලද අංක 354 සහ 1993.02.09 වැනි දින දරන සැලැස්මේ නිරූපිත ලොට් ඩී 2 දරන බිම් කැබැල්ල.

ප්‍රමාණය ඃ අ. 0, රූ. 0, පර්. 11.08.

සහ එහි තුළ ඇති ගොඩනැගිලි ගහකොළ සියලු දේ සමග සහ බලයලත් මානක එම්. බී. ද සිල්වා විසින් මැන සාදන ලද අංක 9352 සහ 1956.09.02 දිනැති සැලැස්මේ දැක්වෙන අඩි 10ක් පළල පාරක් සඳහා වෙන් කරන ලද මාර්ග අයිතිය ද සමග වේ.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. ආර්. හේවතන්ත්‍රි විසින් සහතික කරන ලද අංක 693 සහ 2004 අගෝස්තු මස 30 වැනි දින දරන උකස්කරය මගින් ප්‍රසන්න රංජන් පෙරේරා කුරුකුලසූරිය, ඉන්ස්ස්ටයිල් හෝම්ස් හි තනි අයිතිකරු විසින් උකස් කරන ලද දේපළ.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2009 ජනවාරි මස 09 වැනි දින ලක්බිම, සුඩර් ඔලි සහ ඩේලි නිවුස් පුවත්පත් සහ 2009 ජනවාරි මස 16 වැනි දින ගැසට් පත ද බලන්න.

*දේපළට පිවිසෙන මාර්ගය.*- පිටකෝට්ටේ මංසන්ධියේ සිට කෝට්ටේ පාරේ කිලෝ මීටර් 2ක් පමණ ගිය විට දකුණු පසට මහින්දාරාම පාර හමුවේ. මෙම පාරේ මීටර් 50ක් පමණ ගිය විට පාසල් මාවතට විරුද්ධව දකුණු පසට ඇති පාරේ මීටර් 150ක් 200ක් පමණ ගිය විට වරිපනම් අංක 20/10 මහින්දාරාම පාරේ විකිණීමට ඇති දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසාන වූ විගස ගැනුම්කරු එවලේ ම පහත සඳහන් මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය ඃ

1. ගැනුම් මුදලින් 10%ක් ද,
2. පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1% සහ වැට් බද්ද ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් 2 1/2% ද (සියයට දෙකහමාරක් පමණ),
4. විකිණීමේ සම්පූර්ණ ගාස්තුව හා අනෙකුත් ගාස්තු ද

වෙන්දේසි දිනයේ සිට වැඩ කරන දින 30ක් ඇතුළත ගැනුම් මිලේ පරිශේෂය වන 90% ක මුදල බැංකුවට ගෙවිය යුතුය.

අදාළ ඔප්පු හා අනෙකුත් ලියවිලි පරීක්ෂා කිරීම හා වෙනත් අදාළ තොරතුරු ජ්‍යෝෂ්ඨ කළමණාකරු නීති, පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පී එල් සී, ප්‍රධාන කාර්යාලය, අංක 450, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංකඃ 2565573, 2565565.

රංජිත එස්. මහානාම,
සාම විනිසුරු (මුළු දිවයිනටම),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු,
හා බලයලත් වෙන්දේසිකරු.

ආර්. එස්. එම්. ඔක්ෂන්ස්,
මහනාම ඩ්‍රයිව්,
අංක 474, පිටකෝට්ටේ,
කෝට්ටේ.
දුරකථන අංකය ඃ 2863121.

01-653/5

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය ඃ 1/33231/සීඩී2/652.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය

විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2000.06.09 දින *ගැසට් පත්‍රයේ* සහ 2008.11.08 වැනිදා ලංකාදීප පත්‍රයේ පළ කරනු ලැබුවාවූ ද, යෝජනාවකට අනුකූලව ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොලිය, වියහියදම් හා යථොක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය මීගමුව, ප්‍රනාන්දු ඇවනිව්, අංක 22 හි බලයලත් වෙන්දේසිකාර, ඩබ්. පී. සී. පෙරේරා මහතා විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2009.02.13 වැනි දින පස්වරු 3.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

උපලේඛනය

කොළඹ දිස්ත්‍රික්කයේ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ නගර සභා සීමාව තුළ නුගේගොඩ පිහිටි දුම්රියපොළ පටුමග වරිපනම් අංක 20/18, අම්බලමවත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එස්. වික්‍රමසිංහ විසින් සාදන ලද 1995.01.24 දින හා අංක 6839 දරන මිනුම් පිඹුරේ කැබලි අංක 5 ඒ ලෙස දක්වා ඇති ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 7.5ක් වූ බෙදා වෙන්කළ බිම් කොටස හා ඒ මත පිහිටි සියලු දේත් සමග වේ.

මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත් ඉරු අංක එම් 1463/77 හි ලියාපදිංචි වී ඇත.

තවද, බලයලත් මිනින්දෝරු එස්. වික්‍රමසිංහ විසින් සැකසුනු 1984.09.08 දිනැති හා අංක 1533 දරන පිඹුරේ කැබලි අංක 6 මතින් ඇති මාර්ග අයිතිය ද සමග වේ.

එස්. ඒ. වීරසිංහ,
සාමාන්‍යාධිකාරී.

2009 ජනවාරි මස 09 වැනි දින,
අංක 269, ගාලු පාර, කොළඹ 03.

01-652/1

---

**හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - නිට්ටඹුව ශාඛාව**
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් එස්. ජේ. අතපත්තු විසින් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. නමට ලියා සහතික කරන ලද්දා වූ 1994.04.08, 1999.08.12 සහ 2004.04.28 වැනි දින සහ පිළිවෙලින් අංක 5709, 7946 සහ 9217 දරන බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම පුංචිහේවා අදිකාරිගේ නිමල් චන්ද්‍රසිරි ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල්, සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුලුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපළ 2009ක් වූ පෙබරවාරි මස 18 වැනි දින පෙ. ව. 11.00 ට ඇරඹෙන පරිදි දේපළ පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, (මීගමුව ලියාපදිංචි කොට්ඨාසයේ) ගම්පහ දිස්ත්‍රික්කයේ හාපිටිගම් කෝරළේ, යටිගහ පත්තුවේ, කිතුල්වල, අඹගහවත්ත සහ අඹගහවත්තේ කොටස සහ කහටගහවත්ත දරන ඉඩමට බලයලත් මානක කේ. ඒ. ජී. අමරසිංහ විසින් මැන සාදන ලද 1992.10.17 දිනැති අංක 6388 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් ඒ සහ ඩී ලෙස සලකුණු කරන ලද ඉඩම් කොටස් වේ.

විශාලත්වය :පර්චස් 35.4යි.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2008.07.18 දින දරන රජයේ *ගැසට් පත්‍රය* හා 2008.08.05 වැනි දින අයිලන්ඩ්, දිවයින සහ තිනකරන් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසියේ අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය :

1. ගැනුම් මිලෙන් සියයට දහය (10%)ක්,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එක (1%)ක් ද,
3. වෙන්දේසියේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහ (2.5%)ක් ද,
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදහක් (රු. 2,000)ක් ද,
5. ලිපිකරු හා සෝෂක ගාස්තු රුපියල් පන්සියය (රු. 500)ක් ද,
6. සියලුම ප්‍රචාරක වියදම්.

ගැනුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ගෙවිය යුතුය. දින 30ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති 10%ක මුදල අහිමි කිරීමට සහ දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා අදාළ ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු ජ්‍යෙෂ්ඨ කළමණාකරු (ණය අයකිරීම්), හැටන් නැෂනල් බැංකුව පීඑල්සී, අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10, දුරකථන අංක 2661826 ගෙන් ලබාගත හැක.

රංජිත එස්. මහානාම,
සාම විනිසුරු (මුළු දිවයිනටම),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු,
හා බලයලත් වෙන්දේසිකරු.

ආර්. එස්. එම්. ඔක්ෂන්ස්,
මහානාම ඩ්‍රයිව්,
අංක 474, පිටකෝට්ටේ,
කෝට්ටේ.
දුරකථන අංකය : 2863121.

01-653/1

**හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී – මහරගම ශාඛාව**
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. එල්. ඒ. ඩී. ගුණතිලක විසින් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. නමට ලියා සහතික කරන ලද්දා වූ 2003.10.10 වැනි දින සහ අංක 882 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ඇස්ලි මිචෙල් ඇන්තනි ප්‍රනාන්දු ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල්, සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපළ 2009ක් වූ පෙබරවාරි මස 16 වැනි දින පෙ. ව. 11.00 ට ඇරඹෙන පරිදි දේපළ පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ මහරගම නගර සභාවේ, දෙපානම ගමේ, දෙපානම, පන්නිපිටිය, වීර මාවතේ, වරිපනම් අංක 190/22/එල් හි පිහිටි ගොඩැල්ල වත්ත සහ දොලේ කනත්ත නමැති ඉඩමෙන් බෙදා වෙන් කළ බලයලත් මානක එච්. ඒ. ඩී. ප්‍රේමරත්න විසින් 2001.01.05 දින මැන සාදන ලද පිඹුරු අංක 2973 ලොට් 10 දරන ඉඩම් කොටස සහ ඉහත කී අංක 882 දරන බැඳුම්කරයේ දෙවැනි උපලේඛනයේ සඳහන් මාර්ග අයිතිය ද සමග වේ.

විශාලත්වය : පර්චස් 07 යි.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2008.11.02 දින දරන රජයේ *ගැසට් පත්‍රය* හා 2007.11.16 වැනි දින අයිලන්ඩ්, දිවයින සහ තිනකරන් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසියේ අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය :

1. ගැනුම් මිලෙන් සියයට දහය (10%)ක්,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එක (1%)ක් ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහ (2.5%)ක් ද,
4. ලිපිකරු හා සෝෂක ගාස්තු රුපියල් පන්සියය (රු. 500)ක් ද,
5. සියලුම ප්‍රචාරක වියදම්.
6. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදහක් (රු. 2,000)ක් ද,

ගැනුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ගෙවිය යුතුය.

අදාළ ඔප්පු හා අදාළ ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු ප්‍රධාන කළමණාකරු (ණය අයකිරීම්), හැටන් නැෂනල් බැංකුව පීඑල්සී, අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10, දුරකථන අංකඃ 2661815, 2661816 ගෙන් ලබාගත හැක.

රංජිත එස්. මහානාම,
සාම විනිසුරු (මුළු දිවයිනටම),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු,
හා බලයලත් වෙන්දේසිකරු.

ආර්. එස්. එම්. ඔක්ෂන්ස්,
මහානාම ඩ්‍රයිව්,
අංක 474, පිටකෝට්ටේ,
කෝට්ටේ.
දුරකථන අංකය : 2863121.

01-653/2

---

**පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පවත්වනු ප්‍රසිද්ධ දේපළ වෙන්දේසිය

බැංකුවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව පහත දැක්වෙන දේපළ 2009 පෙබරවාරි 16 වැනි දින ප. ව. 2.30 ට දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ කැස්බෑව ප්‍රාදේශීය සභා සීමාව තුළ පිහිටි බටකැත්තර නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. ඩී. ජී. වීරසිංහ විසින් සාදන ලද අංක 2307 සහ 2002.10.21 වැනි දින දරන සැලැස්මේ නිරූපිත ලොට් 23 දරන බිම් කැබැල්ල සහ හොඳපරගහවත්ත (ටී පී 116901), දෙල්ගහකන්ද (ටී පී 116902), තෙල්ගහවත්තේ කොටස් 2ක් (ටී පී 116903 සහ 233303), දෙල්ගහවත්ත කොටස් 3 ක් (ටී පී පී 116904, 116905 සහ 190181) සහ කෝන්ගහවත්තේ (ටී පී 116906) ප්‍රමාණය අ. 0, රූ. 0, පර්. 10.20 සහ එහි තුළ ඇති ගොඩනැගිලි ගහකොළ සියලු දේ සමග සහ 2307 දරන පිඹුරේ නිරූපිත ලොට් අංක 42, 43 සහ 50 හි මාර්ග අයිතිය ද සමග වේ.

පානදුර ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. ඩී. එස්. ෆොන්සේකා විසින් සහතික කරන ලද අංක 2360 සහ 2006.09.08 දින දරන උකස්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර ඇති හෙයින් වර්ණසූරිය පටබැඳිගේ ප්‍රබෝද් හුමේන්ද්‍ර වර්ණසූරිය සහ චන්දන කීර්තිගේ සිරිල් බැඳුම්කරුවන් වශයෙන් වර්ණසූරිය පටබැඳිගේ ප්‍රබෝද හුමේන්ද්‍ර වර්ණසූරිය උකස්කරු වශයෙන් උකස් කරන ලද දේපළ.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2009 ජනවාරි මස 07 වැනි දින ලක්බිම, සුඩර් ඔලි සහ ඩේලි නිවුස් පුවත්පත් සහ 2009 ජනවාරි මස 16 වැනි දින ගැසට් පතද බලන්න.

*දේපළට පිවිසෙන මාර්ගය.*- කොළඹ කොටුවේ සිට හොරණ පාරේ පිළියන්දල මංසන්ධියේ මීටර් 450ක් පමණ ඉදිරියට ගිය විට දකුණු පසට ඇති මඩපාත පාර හමුවේ. එම පාරේ කිලෝ මීටරයක් පමණ ගිය විට බටකැත්තර හමු වූ විට දකුණු පසට ඇති තාර පාරේ මීටර් 100ක් පමණ ඉදිරියට ගිය විට විකිණීමට ඇති අදාළ දේපළ දකුණු පසට මුහුණලා පිහිටා ඇත. එම ඉඩමේ කෙළවරින් පාරක් ඇත.

*ගෙවීමේ ක්‍රමය.* – වෙන්දේසිය අවසාන වූ විගස ගැණුම්කරු එවලේම පහත සඳහන් මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය.

1. ගැණුම් මුදලින් 10%ක් ද,
2. පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1% සහ වැට් බද්ද ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් 2 1/2% ද (සියයට දෙකහමාරක් පමණ)
4. විකිණීමේ සම්පූර්ණ ගාස්තුව හා අනෙකුත් ගාස්තු ද

වෙන්දේසි දිනයේ සිට වැඩ කරන දින 30ක් ඇතුළත ගැණුම් මිලේ පරිශේෂය වන 90% ක මුදල බැංකුවට ගෙවිය යුතුය.

අදාළ ඔප්පු හා අනෙකුත් ලියවිලි පරීක්ෂා කරීම හා වෙනත් අදාළ තොරතුරු, ජ්‍යෙෂ්ඨ කළමණාකාරු, නීති, පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පී. එල්. සී., ප්‍රධාන කාර්යාලය, අංක 450, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංකඃ 2565573, 2565565.

රංජිත එස්. මහානාම,
සාම විනිසුරු (මුළු දිවයිනටම),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු,
හා බලයලත් වෙන්දේසිකරු.

ආර්. එස්. එම්. ඔක්ෂන්ස්,
මහනාම ඩ්‍රයිව්,
අංක 474, පිටකෝට්ටේ,
කෝට්ටේ.
දුරකථන අංකය : 2863121.

01-653/4

---

### පැන් ඒෂියා බැන්කින් කෝපරේෂන් පීඑල්සී - කුරුණෑගල ශාඛාව

1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන වෙන්දේසිය

**කුරුණෑගල බඩහෙළගම නොහොත් බැද්දේගම පිහිටි රූඩ් 1යි පර්චස් 27 ක් විශාලැති වටිනා නිවසක් සහිත ඉඩමක්**

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වල්ගම්පත්තු කෝරළයේ, දේවමැදි හත්පත්තුවේ, බඩහෙල්ගම නොහොත් බැද්දේගම නමැති ග්‍රාමයේ පිහිටි ගලගාව පිල්ලෑව නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. සී. එස්. එම්. අබේසේකර හා වඩාත් නිවැරදිව ආරියදාස අතපත්තු විසින් සම්පාදිත 2001.06.01 වඩාත් නිවැරදිව 2001.06.03 දිනැති අංක 62/2001 හා දරන පිඹුරේ දැක්වෙන කැබලි අංක 1 දරන පරිශ්‍රය තුළ පිහිටි ගොඩනැගිලි, ගස්කොළන් හා අනෙකුත් සියලු දේ සහ ඉහත කී පිඹුරේ සඳහන් මාර්ග අයිතිය ද සමග වේ.

කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් ඊ. එස්. රූකව විසින් සහතික කරන ලද්දාවූද, කලින් පැන් ඒෂියා බැන්ක් ලිමිටඩ් සහ පැන් ඒෂියා බැන්කින් කෝපරේෂන් ලිමිටඩ් හඳුන්වනු ලද්දාවූ දැනට PQ 48 යටතේ ලියාපදිංචි කර ඇති පැන් ඒෂියා බැන්කින් කෝපරේෂන් පීඑල්සී නමට ලියන ලද්දාවූ ද 2005 ජූනි මස 20 වැනි දින හා අංක 11102 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල ගෙවීමට ඇන්තනී පෙරේරාගේ සමන් දමින්ද පෙරේරා සහ මාදම්පිටියගේ නිර්මල දමයන්ති ප්‍රනාන්දු යන අය පැහැර හැර ඇති බැවින් බැංකුව විසින් මා වෙත පවරන ලද බලය මත ඉහත කී දේපළ මා විසින් වර්ෂ 2009 ක් වූ පෙබරවාරි මස 12 වැනි දින පෙ.ව. 10.30ට දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වැඩිදුර විස්තර සඳහා 2009.01.16 වැනි දින ශ්‍රී ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයද, 2009.01.07 වැනි දින සිලෝන් ඩේලි නිවුස්, ලක්බිම සහ සුදර් ඔලි යන පුවත් පත් බලන්න.

*දේපලට ප්‍රවිශ්ඨ වන මාර්ගය.*- කුරුණෑගල සිට පුත්තලම මහා මාර්ගයේ මහකෙලිය හන්දිය දක්වා සැතපුම් 9 ක් පමණ ගොස් වමට හැරී කටුපොත මාර්ගයේ බමුණාකොටුව හන්දිය දක්වා සැතපුම් 2 3/4 පමණ ගොස් නැවතත් දකුණට හැරී කලුගමුව පාරේ තවත් සැතපුම් 3/4 ගිය පසුව බැද්දෙගමුවේ මෙම දේපළ මාර්ගයට යාබදව වම්පස පිහිටා ඇත.

වෙන්දේසිය අවසානයේදී සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුදල් එවෙලේම වෙන්දේසිකරු වෙත ගෙවිය යුතුයි. (1) ගැනුම් මුදලින් 10% ක් ද, (2) පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1% ක් සහ වැට් බද්ද ද, (3) වෙන්දේසිකරුගේ ගාස්තු වශයෙන් 2 1/2% ක් ද, (4) සියලුම ප්‍රචාරක හා වෙන්දේසි වියදම් ද, (5) ලිපිකරු හා සෝෂක ගාස්තු වශයෙන් රු. 1,500 ක් ද, (6) වෙන්දේසි කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු වශයෙන් රු. 3,000 ක් ද වේ. ගැණුම් මිලේ ඉතිරි 90% ක මුදල වෙන්දේසි දිනයේ සිට දින 30 ක් ඇතුළත ගෙවා අවසන් කළ යුතුයි.

හිමිකම් ඔප්පු සහ අනෙකුත් සියලුම ලියකියවිලි හා විස්තර ලබා ගැනීම සඳහා කොළඹ 03 ගාලු පාරේ අංක 450 දරන ස්ථානයේ පිහිටි පැන් ඒෂියා බැන්කින් කෝපරේෂන් හි ජ්‍යෙෂ්ඨ කළමනාකාරිණි නීති-ගෙන් විමසන්න. දුරකථන අංක : 2565573, 2565570, 2565571 සහ 2565565

පී. කේ. ඊ. සේනාපති,
උසාවි කොමසාරිස් තක්සේරුකරු හා
වරලත් වෙන්දේසිකරු.

134, බැද්දගාන පාර,
කෝට්ටේ,
දුරකථන අංක : 2873656, 0777-672082, ෆැක්ස් : 2871184

01-646

---

### පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී

1990 අංක 04 දරන බැංකු විසින් ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ දේපළ වෙන්දේසියක්

බැංකුවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව පහත දැක්වෙන දේපළ 2009 පෙබරවාරි මස 12 වැනි දින ප.ව. 2.30 ට දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර ප්‍රාදේශීය සභා සීමාව තුළ (වාද්දුව උප කාර්යාලය) පානදුර, තොටමුණ, තල්පිටි දෙබැද්ද, පින්වත්ත පිහිටි කටුකුරුදුතුඩුව ලන්ද කුරුදුවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු පී. එච්. එම්. එල්. ප්‍රේමචන්ද්‍ර විසින් සාදන ලද අංක 4413 සහ 2004.09.22 වැනි දින දරන සැලැස්මේ නිරූපිත ලොට් 10 දරන බිම් කැබැල්ල. ප්‍රමාණය අ. 0, රූ. 0, පර්. 9.90 සහ එහි තුළ ඇති ගොඩනැගිලි ගහකොළ සහ ජී. එච්. එම්. එල්. ප්‍රේමචන්ද්‍ර බලයලත් මිනින්දෝරු තැන විසින් සාදන ලද අංක 4227 හා 12.07.2004 දින දරන සැලැස්මේ නිරූපිත ලොට් 1 බිම් කැබැල්ල ඉහත කී බලයලත් මිනින්දෝරු ජී. එච්. එම්. එල්. ප්‍රේමචන්ද්‍ර විසින්ම සාදන ලද අංක 4413 දරන සැලැස්මේ නිරූපිත ලොට් R2 දරන බිම් කැබැල්ල හා අංක 4308 හා 13.07.2004 දරන සැලැස්මේ නිරූපිත ලොට් B දරන බිම් කැබැල්ල මත වූ මාර්ග අයිතිය ද සමග වේ.

පානදුර ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. ඩී. එස්. ෆොන්සේකා විසින් සහතික කරන ලද අංක 2480 සහ 28.03.2008 දින දරන උකස්කරය මගින් පොල්වත්ත ගාල්ලගේ ප්‍රසාද් සංජීව සමරවික්‍රම සහ කොළඹපටබැඳිගේ උදාන ගනනාත පෙරේරා බැඳුම්කරුවන් වශයෙන් ද, පොල්වත්ත ගාල්ලගේ ප්‍රසාද් සංජීව සමරවික්‍රම උකස්කරුවන් වශයෙන් උකස් කරන ලද දේපළ,

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 03.01.2009 වන දින ලක්බිම සහ ඩේලි නිවුස් පුවත් පත් සහ 02.03.2009 වැනි දින සුඩර් ඔලි පුවත් පතද, 09.01.2009 වැනි දින ගැසට් පත්‍ර බලන්න.

*දේපළට පිවිසෙන මාර්ගය.*-පානදුර මංසන්ධියේ සිට ගාලු පාරේ කිලෝ මීටර් 2.2 ක් පමණ ගිය විට වම් පසට ඇති දිබ්බැද්ද පාරේ කිලෝ මීටර් 1.7 ක් ගිය විට දකුණට ඇති තල්පිටිය පාරේ මීටර් 700 ක් පමණ (වින්වල් වොෂින් ප්ලාන්ට් පසු කර මීටර් 300 ක්) ගොස් වමට හැරී ෆීල්ඩ් පැරඩයිස් පාරේ මීටර් 100 ක් පමණ ගිය විට අදාළ ඉඩම දකුණ පසට පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.*- වෙන්දේසිය අවසාන වූ විගස ගැණුම්කරු එවෙලේම පහත සඳහන් මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය.

1. ගැණුම් මුදලින් 10% ද
2. පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1% සහ වැට් බද්ද ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් 2 1/2%ක්ද (සියයට දෙකහමාරක් පමණ)
4. විකිණීමේ සම්පූර්ණ ගාස්තුව සහ අනෙකුත් ගාස්තු ද.

වෙන්දේසි දිනයේ සිට වැඩ කරන දින 30 ක් ඇතුළත ගැණුම් මිලේ පරිශේෂය වන 90%ක මුදල බැංකුවට ගෙවිය යුතුය.

අදාළ ඔප්පු සහ අනෙකුත් ලියවිලි පරීක්ෂා කිරීම හා වෙනත් අදාළ තොරතුරු ජ්‍යෙෂ්ඨ කළමණාකරු - නීති, පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පී.එල්.සී., ප්‍රධාන කාර්යාලය, අංක 450, ගාලු පාර, කොළඹ 03 දුරකථන අංක : 2565573/2565565

රංජිත එස්. මහානාම,
සාම විනිසුරු (මුළු දිවයිනටම),
උසාවි කොමසාරිස්,
තක්සේරුකරු හා බලයලත් වෙන්දේසිකරු.

ආර්එස්එම් ඔක්ෂන්ස්,
මහානාම ඩ්‍රයිව්,
අංක 474 පිටකෝට්ටේ,
කෝට්ටේ.
දුරකථන අංකය : 2863121

01-653/6

## පැන් ඒෂියා බැන්කින් කෝපරේෂන් පීඑල්සී.- වත්තල ශාඛාව

1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ පවත්වනු ලබන වෙන්දේසියයි. ප්‍රසිද්ධ වෙන්දේසියක්. තම්මිට පිහිටි පර්චස් 39.54 ක් විශාලැති වටිනා නිවසක් සහිත ඉඩමක්

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාල තුළ අළුත්කුරු කෝරළයේ, දාසිය පත්තුවේ මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභා සීමාව තුළ තම්මිට පිහිටි කොස්ගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. ජී. එන්. සඳගිරි විසින් සම්පාදිත 2003.04.21 වැනි දින අංක 888 දරන පිඹුරේ දැක්වෙන කැබලි අංක 1 දරන පරිශ්‍රය තුළ පිහිටි ගොඩනැගිලි, ගස්කොළන් හා අනෙකුත් සියලු දේ.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජේ. ආර්. දොළවත්ත විසින් සහතික කරන ලද්දාවූද, කලින් පැන් ඒෂියා බැන්ක් ලිමිටඩ් සහ පැන් ඒෂියා බැන්කින් කෝපරේෂන් ලිමිටඩ් හඳුන්වනු ලද්දාවූ දැනට PQ48 යටතේ ලියාපදිංචි කර ඇති පැන් ඒෂියා බැන්කින් කෝපරේෂන් පීඑල්සී නමට ලියන ලද්දාවූ ද 2004 අප්‍රේල් මස 16 වැනි දින හා අංක. 1295 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල ගෙවීමට මැක්රන් ඒෂියා ෆුඩ්ස් හි තනි අයිතිකරු වන දෝනා පද්මිණී ඇල්බට් යන අය පැහැර හැර ඇති බැවින් බැංකුව විසින් මා වෙත පවරන ලද බලය මත ඉහත කී දේපළ මා විසින් වර්ෂ 2009 ක් වූ පෙබරවාරි මස 11 වැනි දින පෙ.ව. 10.30ට දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වැඩිදුර විස්තර සඳහා 2009.01.16 වැනි දින ශ්‍රී ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයද, 2009.01.08 වැනි දින සිලෝන් ඩේලි නිව්ස්, ලක්බිම සහ සුදර් ඔලි යන පුවත්පත් බලන්න.

*දේපළට ප්‍රවිෂ්ඨ වන මාර්ගය.*- ඒකළ මංසන්ධියේ සිට (ජාඇල-මිනුවන්ගොඩ පාරේ) ගම්පහ පාරේ කි. මී. 4.5 ක් පමණ ගොස් වමට හැරී තම්මිට පාරේ තවත් කි. මී. 1.5 ක් පමණ සමූපකාර ගබඩාව අසළින් නැවතත් වමට හැරී බොරළු පාරේ මීටර් කිහිපයක් ගමන් කළ පසුව පාරේ වම් පසින් මෙම දේපළ හමුවේ.

වෙන්දේසිය අවසානයේදී සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුදල් එවේලේම වෙන්දේසිකරු වෙත ගෙවිය යුතුයි. (1) ගැණුම් මුදලින් 10% ක් ද, (2) පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1% ක් ද (3) වෙන්දේසිකරුගේ ගාස්තු වශයෙන් 2 1/2%ක්ද, (4) සියලුම ප්‍රචාරක හා වෙන්දේසි වියදම් ද, (5) ලිපිකරු සහ සෝෂක ගාස්තු වශයෙන් රු. 1,500 ක්ද, (7) වෙන්දේසි කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු වශයෙන් රු. 3,000 ක් ද වේ. ගැණුම් මිළේ ඉතිරි 90% ක මුදල වෙන්දේසි දිනයේ සිට දින 30 ක් ඇතුළත ගෙවා අවසන් කළ යුතුයි.

හිමිකම් ඔප්පු සහ අනෙකුත් සියලුම ලියකියවිලි හා විස්තර ලබා ගැනීම සඳහා කොළඹ 03, ගාලු පාරේ, අංක 450 දරන ස්ථානයේ පිහිටි පැන් ඒෂියා බැන්කින් කෝපරේෂන් හි ජ්‍යෙෂ්ඨ කළමනාකාරිණී නීති ගෙන් විමසන්න. දුරකථන අංක : 2565573, 25655570, 2565571 සහ 2565565.

පී. කේ. ඊ. සේනාපති,
උසාවි කොමසාරිස් තක්සේරුකරු හා වරලත් වෙන්දේසිකරු.

134, බැද්දගාන පාර,
කෝට්ටේ,
දුරකථන අංක : 2873656, 0777-672082. ෆැක්ස් : 2871184.

01-645

**පෑන් ඒෂිය බෑන්කින් කෝපරේෂන් පීඑල්සී - රාජගිරිය ශාඛාව**

1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 යටතේ පවත්වනු ලබන වෙන්දේසිය

**ප්‍රසිද්ධ වෙන්දේසියක්. වල්ගම පිහිටි පිළිවෙලින් පර්චස් 18.6ක් සහ රූඩ් 2 පර්චස් 9 විශාලැති වටිනා නිවසක් සහිත ඉඩම් කැබැලි දෙකක්**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, බියගම ප්‍රාදේශීය සභා පරිපාලන සීමාව තුළ සියනෑ කෝරළේ, අධිකාරි පත්තුවේ, වල්ගම පිහිටි 'කෝන්ගහවත්ත සහ හඳ පාන්වැල්ල කුඹුර' නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු එල්. ජේ. ලියනගේ විසින් සම්පාදිත 1987.10.22 සහ අංක 5204 දරන පිඹුරේ නැවතත් බෙදා වෙන්කරනු ලැබුවාවූ බලයලත් මිනින්දෝරු පී. සින්නතම්බි විසින් සම්පාදිත 1993.12.18 වැනි දින අංක 4302 දරන පිඹුරේ දැක්වෙන කැබලි පිළිවෙලින් අංක A සහ කැබලි අංක B දරන කොටස් තුළ පිහිටියා වූ ගස්කොළන්, වැවිලි, ගොඩනැගිලි හා අනෙකුත් සියලු දේ.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. ආර්. හේවාතන්ත්‍රී විසින් සහතික කරන ලද්දාවූද, කලින් පෑන් ඒෂියා බෑන්ක් ලිමිටඩ් සහ පෑන් ඒෂියා බෑන්කින් කෝපරේෂන් ලිමිටඩ් හඳුන්වනු ලද්දාවූ දැනට PQ 48 යටතේ ලියාපදිංචි කර ඇති පෑන් ඒෂියා බෑන්කින් කෝපරේෂන් පීඑල්සී නමට ලියන ලද්දාවූද 2006 මාර්තු මස 29 වැනි දින හා අංක 948 දරන බැඳුම්කරය යටතේ අයවියයුතු මුදල ගෙවීමට 'කාර්ට්‍රිව් ලංකා' යන ආයතනයේ හවුල්කරුවන් වන මොහමඩ් හලීම් මොහමඩ් හිහාන්, සෙයියදු ෆාතිමා හලීම් නොහොත් අබ්දුල් ගානි සෙයියදු ෆාතිමා හලීම් නොහොත් සෙයියදු ෆාතිමා රාහුමාන් නිසා සහ ෆාතිමා රිනුෂා හලීම් යන අය බැඳුම්කරුවන් හැටියට සහ සෙයියදු ෆාතිමා හලීම් නොහොත් අබ්දුල් ගානි සෙයියදු ෆාතිමා හලීම් නොහොත් සෙයියදු ෆාතිමා රහුමාන් නිසා සහ ෆාතිමා රිනුෂා හලීම් උකස්කරුවන් හැටියට පැහැර හැර ඇති බැවින් බැංකුව විසින් මා වෙත පවරන ලද බලය මත ඉහත කී දේපළ මා විසින් වර්ෂ 2009 ක් වූ පෙබරවාරි මස 10 වැනි දින පෙ.ව. 10.00ට දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වැඩිදුර විස්තර සඳහා 2009.01.16 දින ශ්‍රී ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයද, 2009.01.08 වැනි දින සිලෝන් ඩේලි නිව්ස්, ලක්බිම සහ සුදර් ඔලි යන පුවත්පත් බලන්න.

*දේපළට ප්‍රවිෂ්ට වන මාර්ගය* .- පැලියගොඩ හන්දියේ සිට නුවර පාරේ, බියගම පාර ඔස්සේ බංඩාරවත්ත මංසන්ධිය පසුකර කි. මී. 14 ක් පමණ මල්වාන පාර පටන්ගන්නා මංසන්ධිය දක්වා ගොස් තවත් කි. මී. 3/4 ක් පමණ ඉදිරියට ගොස් මල්වාන මංසන්ධියෙන් වමට හැරී තවත් කි. මී. 1/4 ක් පමණ ගිය පසුව හමුවන ෂහීඩ් හජ්ජියාර් මාවතේ මීටර් 100 ක් පමණ ගිය පසුව මෙම දේපළ හමුවේ.

වෙන්දේසිය අවසානයේදී සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුදල් එවෙලේම වෙන්දේසිකරු වෙත ගෙවිය යුතුයි. (1) ගැණුම් මුදලින් 10 % ක්ද, (2) පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1% ක්ද සහ වැට් බද්ද, (3) වෙන්දේසිකරුගේ ගාස්තු වශයෙන් 2 1/2% ක් ද, (4) සියලුම ප්‍රචාරක හා වෙන්දේසි වියදම් ද, (5) ලිපිකරු සහ සෝෂක ගාස්තු වශයෙන් රු. 1,500 ක් ද, (6) වෙන්දේසි කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු වශයෙන් රු. 3,000 ක් ද වේ. ගැණුම් මිලේ ඉතිරි 90% ක මුදල වෙන්දේසි දිනයේ සිට දින 30 ක් ඇතුළත ගෙවා අවසන් කළ යුතුයි.

හිමිකම් ඔප්පු සහ අනෙකුත් ලියාකියවිලි හා විස්තර ලබා ගැනීම සඳහා කොළඹ 03, ගාලු පාරේ, අංක 450 දරන ස්ථානයේ පිහිටි පෑන් ඒෂියා බෑන්කින් කෝපරේෂන් හි ජ්‍යෝෂ්ඨ කළමනාකාරිණී නීතිගෙන් විමසන්න. දුරකථන අංක : 2565573. 25655570, 25655571 සහ 2565565.

පී. කේ. ඊ. සේනාපති,
උසාවි කොමසාරිස් තක්සේරුකරු හා වරලත් වෙන්දේසිකරු.

134, බැද්දගාන පාර,
කෝට්ටෙ,
දුරකථන අංක : 2873656, 0777-672082. ෆැක්ස් : 2871184

01-644

---

**රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව**

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංක : ජීපී/02/00281/බී2/837.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2005.03.04 වැනි දින ගැසට් පත්‍රයේ සහ 2005.07.11 වැනිදා දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවාවූද, යෝජනාවකට අනුකූලව, ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොළිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අය කර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය මීගමුව, ප්‍රනාන්දු මාවත, අංක 22 හි බලයලත් වෙන්දේසිකාර ඩබ්. පී. සී. පෙරේරා මහතා විසින් එම දේපළ පිහිටි ස්ථානයේදී 2009.02.13 වැනි දින පෙරවරු 10.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

ගම්පහ දිස්ත්‍රික්කයේ, වත්තල ප්‍රාදේශීය සභා සීමාවේ, දුන්ගල්පිටිය පමුණුගම දකුණු පාරේ වරිපනම් අංක 922/1 දරන ස්ථානයේ පිහිටි රජ්ජුරුවන්ගෙවත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ඩබ්. බී. එල්. ප්‍රනාන්දු විසින් මැන සැකසුණු 1998.01.29 වැනි දින හා 1998.08.20 වැනි දිනයන්හි හා අංක 3237 දරන පිඹුරේ කැබලි අංක ඒ ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 16 ක්වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ ඒ මත පිහිටි සියලු දේත් සමග වේ.

මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත්ඉරු අංක සී 832/125 හි ලියාපදිංචි වී ඇත.

එස්. ඒ. වීරසිංහ,
සාමාන්‍යාධිකාරී.

2009 ජනවාරි මස 09 වැනි දින,
අංක 269, ගාලු පාර, කොළඹ 03.

01-652/2

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : 2/69472/බී2/130.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ 2005.09.23 දින *ගැසට් පත්‍රයේ* සහ 2005.11.14 වැනි දා දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවාවූද, යෝජනාවකට අනුකූලව, ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොළිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අය කර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපල හා භූමිය මීගමුව, ප්‍රනාන්දු මාවත, අංක 22 හි බලයලත් වෙන්දේසිකාර ඩබ්. පී. සී. පෙරේරා මහතා විසින් එම දේපල පිහිටි ස්ථානයේදී 2009.02.13 වෙනි දින මධ්‍යාහ්න 12.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ලියාපදිංචි කොට්ඨාසයේ, කටාන ප්‍රාදේශීය සභා සීමාව තුල රද්දොළුව උප කාර්යාල සීමාවේ කොටරුපේ පිහිටි දෙල්ගහවත්ත සහ සියඹලාගහවත්ත නමැති ඉඩමේ බලය ලත් මිනින්දෝරු කේ. ඒ. ජේ. බී. පෙරේරා විසින් සකසන ලද අංක 5748 සහ 1998.12.10 දිනැති පිඹුරේ කැබලි අංක 35 ලෙස දක්වෙන (බලය ලත් මිනින්දෝරු පී. ඩී. එන් පීරිස් විසින් සැකසුණු 1998.05.28 දිනැති සහ අංක 1189 දරන පිඹුරේ නැවත මැණුමකි). ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 9.1 ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ ඊට අයිති සියලු දේත් සමග වේ.

මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත් ඉරු අංක බී 141/225 හි ලියාපදිංචි වී ඇත.

තවද එකී අංක 5748 දරන මිණුම් පිඹුරේ කැබලි අංක 51, 52, 54 සහ 55 දරන ඉඩම් කොටස මතින් වෙන්කර ඇති සම්පූර්ණ සහ නිදහස් මාර්ග අයිතීන්ද සමග වේ.

එස්. ඒ. වීරසිංහ,  
සාමාන්‍යාධිකාරී.

2009 ජනවාරි මස 09 වැනි දින,  
අංක 269,  
ගාලු පාර, කොළඹ 03.

01-652/3

---

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී - මහවීදිය ශාඛාව

1990 අංක 4 දරන බැංකු මඟින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ) විධිවිධාන පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. (ලියාපදිංචි අංක පී. කිව්. 116)හි අධ්‍යක්ෂ මණ්ඩලය මගින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බලයලත් මානක සී. සෙනෙවිරත්න විසින් 2003 ජනවාරි මස 7 වැනි දින මැන සාදන ලද අංක 1447 දරන පිඹුර පරිදි බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ රාගම් පත්තු අළුත්කුරු කෝරළේ ජාඇල ප්‍රාදේශීය සභා සීමාව තුළ රාගම පිහිටි බටගම පාරේ වරිපනම් අංක 199/3 සහ 199/1 දරන දෙල්ගහවත්ත ඉඩමේ ලොට් 3 දරන පර්චස් තිස්හයයි දශම හතරයි හතක් (අ. 0, රූ. 0 ,පර්. 36.47) විශාල ඉඩම් කොටස සහ එහි පිහිටි ගොඩනැගිලි සහ සියලු දේත් සමගි වේ.

මිහිඳුකුලසූරිය ජුවන් වර්ණගේ ප්‍රියන් පර්නැන්ඩු සහ මහවිජයමුනි සරනි සවන්තිකා සිල්වා ණයකරුවන් හැටියට ද, ඔවුන් විසින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. ට උකස් කරන ලද ඉහත සඳහන් කළ දේපල, 2009 පෙබරවාරි මස 24 වැනි දින පෙ.ව . 11.30 ට ඉහත ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2008.10.24 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද, සහ ද අයිලන්ඩ්, ලක්බිම සහ වීරකේසරී පුවත්පත් ද බලන්න. විකිණීම පිළිබඳ දැන්වීම සඳහා 2009.01.23 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද සහ 2009.01.26 වැනි දින දිවයින සහ ද අයිලන්ඩ් පුවත්පත් බලන්න.

*ඉඩමට පිවිසීම.* - කඳාන මංසන්දියේ සිට ගම්පහ පාරේ (රාගම පාරේ) බෝයිස් ටවුන් පාර දක්වා යන විට (ලංකා ලොයිඩ් ලිමිටඩ්ට විරුද්ධ පසින්) වම් පසින් පිහිටා ඇති පාරේ කි. මී. 1ක් පමන ගිය විට අදාල දේපල වලට දකුණු පසින් ඇති අඩි 12ක් පළල පාරක් සඳහා වෙන්කොට ඇති පාරේ ගිය විට ඊට පිවිසිය හැක.

*ගෙවීමේ ක්‍රමය.*- විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුය :-

1. ගැණුම් මිළෙන් සියයට දහයක් (10%),
2. පලාත් සභා අයබදු සඳහා සියයට එකයි (01%),
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් ගැණුම් මිලෙන් සියයට දෙකයි දශම පහක් (2.5%),
4. නොතාරිස් ගාස්තුව රු. 2,000,
5. ලිපිකරු හා සෝෂක වේතනය රු. 500,
6. වෙන්දේසිය සඳහා වැය කරන ලද සියලුම ප්‍රචාරක නියදම්.
7. ගැණුම් මිළෙන් ඉතිරි සියයට අනුව (90%) විකිණීමේ දින සිට දින 30ක් තුළ දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලොන් පී. එල්. සී. ප්‍රධාන කාර්යාලයේ හෝ මහවීදිය ශාඛාවේ තැන්පත් කළ යුතුයි.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරිම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න.

එල්. බී. සේනානායක,  
සාම විනිසුරු,  
බලයලත් ජ්‍යෂ්ඨ වෙන්දේසිකරු,  
තක්සේරුකරු සහ උසාවි කොමසාරිස්,  
කොළඹ වාණිජ මහාධිකරණය සහ  
දිසා අධිකරණය,  
බලයලත් ජ්‍යෂ්ඨ වෙන්දේසිකරු,  
රාජ්‍ය සහ වාණිජ බැංකු,  
අංක 99, උසාවිය පාර, කොළඹ 12.  
දුරකථන/ෆැක්ස් : 2445393.

කළමනාකරු,  
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී.  
කොළඹ 11.  
දුරකථන අංක : 2380490.

01-626

**මහජන බැංකුව - ජාඇල ශාඛාව**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

ජාඇල නගර සභා සීමාවේ, ලේක්සිටි නිවාස සංකීර්ණයේ නවීන මාදිලියේ වටිනා දෙමහල් නිවසක් සහිත පර්චස් එකොළහයි දශම දෙකයි බිංදුව (අ. 0, රූ. 0, පර්. 11.20) ක ඉඩම.

මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින්, 2009.02.11 වැනි දින පෙ. ව. 11.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ දේපල පිහිටි ස්ථානයේදී විකුණනු ලැබේ.

*රජයේ ගැසට් පත්‍රයේ* 2008.10.24 දින ද, ඩේලිනිව්ස්, දිනමිණ, සහ තිනකරන් පුවත්පත් වල 2008.10.24 දින ද, පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම.* - ජාඇල මධ්‍යම බස් නැවතුම්පල අසල පිහිටි, ලේක්සිටි නිවාස සංකීර්ණයේ ප්‍රධාන පිවිසුමෙන් ඇතුල් වී වම්පසට ඇති මාර්ගයේ මීටර් 200ක් පමණ ගොස් නැවත දකුණු පසට මීටර් 50ක් පමණ යනවිට වම් පසින් ළමා උද්‍යානයට ආසන්න ලොට් අංක 293 හි දේපල හමුවේ.

*ගෙවීමේ ක්‍රමය.*-වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය :-

1. ගැණුම් මිළෙන් 1.0%ක්,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1%ක්,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිළෙන් 2 1/2%ක්,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500ක්,
5. විකුණුම් වියදම් සමඟ වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිළෙන් ඉතිරි 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත, කළමනාකරු, මහජන බැංකුව, ජාඇල ශාඛාව වෙත ගෙවිය යුතුය.

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මුදලින් 10%ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපල විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාල විස්තර පහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක.

ප්‍රාදේශීය කළමනාකාර, මහජන බැංකුව, ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාල, අංක 131, නුවර පාර, බැලුම්මහර, මුදුන්ගොඩ.

දුරකථන අංක : 038-2222325, 033 - 2226165

ෂොක්මන් සහ සමරවික්‍රම,
රජයේ අනුමත ISO 9001 :2000 සහතිකය ලත්
ශ්‍රී ලංකාවේ පිළිගත් පුරෝගාමී වරලත්
වෙන්දේසිකරුවෝ, තක්සේරුකරුවෝ සහ
දේපල ඒජන්තවරු.

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර, මහනුවර.
දුරකථන අංක : 081- 2227593,
දුරකථන : ෆැක්ස් අංකය : 081-2224371
ඊමේල් : schokmankandy@sltnet.lk

*නාගරික කාර්යාලය සහ ප්‍රදර්ශනාගාරය :*
අංක 290, හැව්ලොක් පාර, කොළඹ 05,
දුරකථන අංක : 011-2502680, 2585408
දුරකථන ෆැක්ස් අංකය : 011-2588176
ඊමේල් : schokman@samera1892.com

www.shokmanandsamerawickreme.com

01-619

---

**ලංකා බැංකුව**

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ 22 වැනි වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

කැළණිය, කිරිබත්ගොඩ, මහනුවර පාර, අංක 6 ඒ හි පිහිටි සීමාසහිත ඉන්දියන් පැෂන් (පුද්ගලික) ආයතනය සහ රාගම, කුරුකුලාව, අංක 221 /වී හි පදිංචි එස්. විලියම්ස් මහත්මිය විසින් උකස් කළ දේපළ

ණය යොමු අංකය 5940799 සහ 5943761.

ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2008.12.05 දිනැති අංක 1579 දරන *ගැසට් පත්‍රයේ* හා 2008.11.21 දිනැති ඩේලිනිව්ස්, දිනමිණ හා 2008.11.24 දිනැති තිනකරන් යන පුවත්පත්වල පළ කරන ලද යෝජනාවකට අනුකූලව එකී ආඥාපනතේ අංක 26 දරන වගන්තිය යටතේ අයකර ගතහැකි මුල් මුදලේ ශේෂය ද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොලිය ද, ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපල හා පරිශ්‍ර පිහිටි ස්ථානයේ දී ම 2009.02.28 වැනි දින (සෙනසුරාදා) පෙ.ව. 11.30ට කෝට්ටේ, පිටකෝට්ටේ, අංක 474හි පදිංචි වෙන්දේසිකාර ආර්. එස්. එම්. වෙන්දේසිකරුවෝ හි ආර්. එස්. මහානාම මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළයේ, අදිකාරිපත්තුවේ, වත්තල ප්‍රාදේශීය සභා සීමාවේ (වැලිසර උප කාර්යාලය)

මහර කුරුකුලාව ග්‍රාමයේ පිහිටි කුරුකුලාව පාර, දකුණේ වරිපනම් අංක 296/30 දරන පඹුරුගහවත්ත හෙවත් ලිඳමුලකොටුව නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු කේ. ඒ. රූපසිංහ විසින් සාදන ලද 2000 ජූලි මස 08 දිනැති අංක 440/2000 දරන මිණුම පිඹුරේ විස්තර කළ ලොට් වී වශයෙන් සඳහන් බෙදන ලද්දාවූ නිශ්චිත ඉඩම් කැබැල්ල උතුරට ලොට් ටී සහ යූ ද, නැගෙනහිරට : ලොට් ආර් 2 ද, (අඩි 15ක් පළල පාරක් සඳහා වෙන්කළ), දකුණට : කලින් වී. අගිදා සහ ගිරිගෝරිස් නානායක්කාරට ද, වර්තමානයේ උප බෙදුමක් කර විකුණන ලද ඉඩම ද, බස්නාහිරට : කලින් වී. අගිදා සහ ගිරිගෝරිස් නානායක්කාරටද, වර්තමානයේ උප බෙදුමක් කර විකුණන ලද ඉඩම ද මායිම්ව එකී අංක 440/2000 දරන පිඹුර අනුව පර්චස් දාහතරයි දශම හයයි පහක (අ. 0 රූ. 0 පර්. 14.65) බිම් ප්‍රමාණය සමග එහි පිහිටි ගොඩනැගිලි සහ සියලු දේ වේ. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 618/249 හි ලියාපදිංචි කර ඇත. තවද, එකී අංක 440/2000 දරන පිඹුරේ විස්තර කළ ලොට් ආර් 1, ආර් 2, ආර් 3, ආර් 4 මත මාර්ග අයිතිය ද වේ.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

බී. එම්. ප්‍රේමරත්න,
ජ්‍යෙෂ්ඨ කළමනාකරු.

2009 වැනි ජනවාරි මස 05 වැනි දින,
ලංකා බැංකුව,
කොල්ලුපිටිය අධිශ්‍රේණි ශාඛාව.

01-678

---

රුහුණ සංවර්ධන බැංකුව - ගන්දර ශාඛාව

1990 අංක 04 දරන බැංකු මඟින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

රුහුණ සංවර්ධන බැංකුවෙන් මා වෙත පවරන ලද බලය මත මෙහි පහත විස්තර වන දේපල 2009.02.13 දින පෙ.ව. 10.30 ට එම දේපල පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

දේපළ පිළිබඳ විස්තරය

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැල්ලබඩපත්තුවේ, බතිගම පිහිටි කොහුවලවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු බී. ජී. කරුණාදාස මහතා විසින් මැන සකස් කරන ලද 1983.03.02 දින දරන අංක 243 දරන සැලැස්මේ දක්වා ඇති රූඩ් එකයි, පර්චස් තුනයි දශම එකක් (අ. 0, රූඩ්. 01, පර්. 3.1) ක් විශාල අංක 01 දරන කැබැල්ලේ බිමත් සියලු වැවිලි සහ ගොඩනැගිලි ද වේ. තවද අංක ඉහත කී අංක 243 දරන සැළැස්මේ අංක 03 දරන කැබැල්ල පාරක් වශයෙන් පාවිච්චි කිරීමේ අයිතිය ද වේ.

වැඩි විස්තර සඳහා 2003.08.15 දින රජයේ ගැසට් පත්‍රයද 2008.06.13 දින දිනමිණ, තිනකරන් හා ද අයිලන්ඩ් යන පුවත්පත්වලද පළ කර ඇති වෙන්දේසි යෝජනාවට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම.-* මාතර - දික්වැල්ල පාරේ බතිගම පිහිටි ''විලේජ්'' හෝටලය ඉදිරියෙන් පිහිටි පාරේ මීටර් 60 ක් පමණ ගිය විට මෙම දේපල හමුවේ.

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසිය තීන්දු කළ විගස පහත සඳහන් මුදල් ගැණුම්කරු විසින් මුදලින් ගෙවිය යුතුය :-

01. ගැණුම් මිළෙන් 25%ක්ද,
02. පළාත් අධිකාරියේ බදු සඳහා විකුණුම් මිලෙන් 1% ක් ද,
03. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිළෙන් 2 1/2% ක්ද,
04. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500 ක් ද,
05. විකුණුම් වියදම සහ වෙනත් ගාස්තු ඇතොත් එම මුදල ද
06. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු ද වේ.

ගැණුම් මිලෙන් ඉතිරි 75% ක් වූ මුදල වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත මාතර, පඹුරන, අනගාරික ධර්මපාල මාවතේ අංක 382 ඒ දරන ස්ථානයේ පිහිටි රුහුණ සංවර්ධන බැංකුවේ, ප්‍රධාන කාර්යාලයේ සාමාන්‍යාධිකාරීතුමාට ගෙවිය යුතුය.

ඉහත සඳහන් පරිදි දින 30 ක් ඇතුළත අදාල මුදල නොගෙවුවහොත් දැනටමත් ගැණුම් මිලෙන් ගෙවා ඇති 25% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපල විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාල විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක.

දුරකථන අංක : 041-2231532, 2226208, 2226209, 091-2291163

ජී. පී. ආනන්ද,
සාමවිනිසුරු, බලයලත් වෙන්දේසිකරු,
උසාවිකොමසාරිස් හා තක්සේරුකරු

කුරුඳුවත්ත, වල්ගම, මාතර.
දුරකථන අංක : 041-2228731

01-498/1

---

රුහුණ සංවර්ධන බැංකුව - ගන්දර ශාඛාව

1990 අංක 04 දරන බැංකු මඟින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

රුහුණ සංවර්ධන බැංකුවෙන් මා වෙත පවරන ලද බලය මත මෙහි පහත විස්තර වන දේපල 2009.02.10 දින පෙ.ව. 10.30 ට එම දේපල පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

දේපළ පිළිබඳ විස්තරය

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැල්ලබඩපත්තුවේ, දෙවිනුවර ප්‍රාදේශීය සභා සීමාව තුළ දෙවිනුවර පිහිටි, වරිපනම් අංක 224 දරන ගුරුවෙ පදිංචිව සිටිය වත්ත නමැති ඉඩම, බලයලත් මිනින්දෝරු ඩබ්. පී. සුනිල් මහතා විසින් මැන සාදන ලද 1998.03.28 දිනැති අංක 91 දරන සැළැස්මේ කැබලි අංක 01 ලෙස දක්වා ඇති පර්චස් විසිහයයි දශම හයයි නවයක් (අ. 0, රූ. 0, පර්. 26.69) ක් විශාල ඉඩමත්, එහි තුළ පිහිටි වැවිලි, ගොඩනැගිලි ආදී සියළු දේත් වේ.

වැඩි විස්තර සඳහා 2007.06.08 දින රජයේ *ගැසට් පත්‍රයද* 2007.12.07 දින දිනමිණ, තිනකරන් හා ද අයිලන්ඩ් යන පුවත්පත් වලද පළ කර ඇති වෙන්දේසි යෝජනාවට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම.*-දෙවිනුවර ඔරලෝසු කණුව අසළින් වැටී ඇති ලයිට් හවුස් පාරේ මීටර් 300 ක් පමණ ගිය විට පාරේ වම්පස මෙම දේපල පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.*- වෙන්දේසිය තීන්දු කළ විගස පහත සඳහන් මුදල් ගැණුම්කරු විසින් මුදලින් ගෙවිය යුතුය :-

01. ගැණුම් මිලෙන් 25% ක් ද,
02. පළාත් අධිකාරියේ බදු සඳහා විකුණුම් මිලෙන් 1% ක් ද,
03. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% ක් ද,
04. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500 ක් ද,
05. විකුණුම් වියදම සහ වෙනත් ගාස්තු ඇතොත් එම මුදල ද ,
06. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු ද වේ.

ගැණුම් මිලෙන් ඉතිරි 75% ක් වූ මුදල වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත මාතර, පඹුරන, අනගාරික ධර්මපාල මාවතේ අංක 382 ඒ, දරන ස්ථානයේ පිහිටි රුහුණ සංවර්ධන බැංකුවේ, ප්‍රධාන කාර්යාලයේ සභාපතිතුමාට ගෙවිය යුතුය.

ඉහත සඳහන් පරිදි දින 30 ක් ඇතුළත අදාළ මුදල නොගෙවුවහොත් දැනටමත් ගැණුම් මිලෙන් ගෙවා ඇති 25% මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක.

දුරකථන අංක 041-2231532, 2226208, 2226209, 2259585

ජී. පී. ආනන්ද,
සාමවිනිසුරු, බලයලත් වෙන්දේසිකරු,
උසාවි කොමසාරිස් හා තක්සේරුකරු.

කුරුඳුවත්ත, වල්ගම, මාතර,
දුරකථන අංකය : 041-2228731.

01-498/2

---

## සෙලාන් බැංකුව පීඑල්සී- ෆස්ට් සිටි ඔෆිස් ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ විකිණීම

මෙම දේපල උස්වැටකෙයියාව පදිංචි ජයමාන්න මොහොට්ටිගේ දොන් ඇන්තනී මයිකල් සහ උස්වැටකෙයියාව ලියාපදිංචි අංක එන් (පීවීඑස්) 703 දරන 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ යථා පරිදි සංස්ථාපිත සමාගමක් වන ''ස්රිවික් සී ෆුඩ්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්'' යන අය බන්ධනදායී වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙතින් ලබා ගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

#### පළමුවන වෙන්දේසියේ විකිණීම

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරලේ රාගම් පත්තුවේ උස්වැටකෙයියාව පරණ අම්බලම වරිපනම් අංක 102 දරන ගල්බානතොටවත්ත නමැති ඉඩම් කොටස. බලයලත් මිනින්දෝරු ඒ. සී. අලස් විසින් සාදන ලද 1957.05.08 දිනැති අංක 1423 දරන සැලැස්ම අනුව රූඩ් එකයි පර්චස් තිස් හයක් (අ. 0, රූ. 1, පර්. 36) විශාල ඉඩම. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 214/244 හි ලියාපදිංචි කර ඇත.

එහි පිහිටි ගොඩනැගිලි, ගස්, වගා සහ අනෙකුත් සියළු දේ සමග ඉඩම 2009 පෙබරවාරි මස 17 වැනි දින පෙරවරු 10.00 ට එම දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපලට පිවිසීම.*- කොළඹ කොටුවේ සිට මීගමුව පාරේ හැඳල හන්දියට පැමිණ එතැනින් ඇලකන්ද හන්දියට පැමිණ දකුණට ඇති කැනැල් පාරේ කි. මී. 3.8 ක් දුර ගොස් හමුවන උස්වැටකෙයියාව පල්ලිය පසුකර තවත් කි. මී. 1.4 ක් බෝපිටිය පාරේ ගිය විට හමුවන ස්රිමික් සී ෆුඩ්ස් ප්‍රයිවෙට් ලිමිටඩ් ආයතනය ඉදිරිපස අසල දේපල පිහිටා ඇත.

#### දෙවන වෙන්දේසියේ විකිණීම

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කරු කෝරලේ, රාගම් පත්තුවේ වත්තල ප්‍රාදේශීය සභාවේ පමුණුගම උප කාර්යාල සීමාව තුළ පරණ අම්බලම පිහිටි බලයලත් මිනින්දෝරු එන්. ඩී. පී. සී. ගුණසේකර විසින් සාදන ලද 1993.11.23 දිනැති අංක 470 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන නුගගහඹිවිට සහ ගල්බානතොටේවත්ත නමැති කොළඹ පාර වරිපනම් අංක 209/4 දරන ලොට් ඩී ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස. එකී අංක 470 දරන සැලැස්ම අනුව රූඩ් එකයි පර්චස් පහලොවයි දශම අටයි දෙකක් (අ. 0, රූ. 1, පර්. 15.82) විශාල, ගොඩනැගිලි, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 296/139 හි ලියාපදිංචි කර ඇත. එකී 470 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන අඩි 10ක් පළළ සහ අඩි 12ක් පළල යනුවෙන් ලකුණු කළ මාර්ගය සඳහා වෙන් කිරීම තුළ උඩින් සහ දිගේ මාර්ග අයිතිය සමග.

ඉහත සඳහන් දේපල 2009 පෙබරවාරි මස 17 වැනි දින පෙරවරු 10.15 ට එම දේපල පිහිටි ස්ථානයේ මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ඉඩමට පිවිසීම.*- ඇළකන්ද හන්දියේ සිට කැනැල් පාරේ කි. මී. 3.8 ක් ගිය විට හමුවන උස්වැටකෙයියාව පල්ලිය පසුකර බෝපිටිය පාරේ තවත් කි. මී. 1.4 ක් ගිය විට හමුවන ස්රිමික් සී fපුඩ්ස් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය පසුකර තවත් මීටර් 50 ක් ගොස් දකුණට ඇති අඩි 12 ක් පළළ පුද්ගලික පාරේ ඉඩම පිහිටා ඇත.

#### තුන්වන වෙන්දේසියේ විකිණීම

| *අයිතම් අංකය* | *ප්‍රමාණය* | *විස්තරය* |
|---|---|---|
| 1 | 04 | කන්ටැක්ට් ප්ලේට් ෆ්‍රිසර්ස් මොඩ්ල් එස්පීඑෆ් 01-08-ආර් 22 සෙල්ප් කන්ටේන්ඩ් රිෆ්‍රිජිරේෂන් ධාරිතාව 200 කි. ග්‍රෑ. පැය 3 ස්පිඩ් ෆ්‍රිස් ටෙක්නොලොජි සිංගප්පූරුව නිෂ්පාදිත රට - ජර්මනිය මිලදී ගත් වර්ෂය : 1993-1, 1994-3 |
| 2 | 01 | බ්ලාස්ට් ෆරිසර් මොඩ්ල් බීජී 642ටී මේක් - බයිට්ර් ඕපන් ඩ්‍රයිව් මෝටර 45එච්පී, වර්ගය- වී- 041305, ධාරිතාව 500 කි. ග්‍රෑ. පැය 3 නිෂ්පාදිත රට - ජර්මනිය, මිලදී ගත් වර්ෂය - 1994 |

| අයිතම් අංකය | ප්‍රමාණය | විස්තරය |
|---|---|---|
| 3 | 01 | සීතල කාමර මේක් -බයිටර්<br>වර්ගය - වී- 331446<br>ධාරිතාව - ටොන් 30<br>නිෂ්පාදිත රට - ජර්මනිය<br>මිලදී ගත් වර්ෂය - 1994 |
| 4 | 01 | සීතල කාමර මේක් - බයිටර්<br>වර්ගය - වී - 100734<br>ධාරිතාව - ටොන් 15<br>නිෂ්පාදිත රට - ජර්මනිය<br>මිලදී ගත් වර්ෂය - 1994 |
| 5 | 01 | ස්ටැන්ඩ්බයි විල්සන් ජෙනරේටර්<br>මේක් - විල්සන් පී6 පියස්<br>ඕල්ටර්නේටර් - ස්ටැම්ෆර්ඩ්<br>3 ජෙස් -400/415 වොල්ට්ස් 50 හර්ට්ස්<br>පී. එෆ්. 0.8<br>නිෂ්පාදිත රට - එංගලන්තය<br>මිලදී ගත් වර්ෂය -1994 |
| 6. | 10 | හයිඩ්‍රොලික් කිරණ තරාදි<br>මේක් : බර්ක්ල්<br>ධාරිතාව - 0.500 කි. ග්‍රෑ.<br>නිෂ්පාදිත රට - ඇමරිකා එක්සත් ජනපදය<br>මිලදී ගත් වර්ෂය - 1995 |
| 7 | 20 | ස්ටේන්ල්ස් ස්ටීල් මේස<br>8' x 4' x 2 1/2<br>දේශීය නිෂ්පාදිත<br>මිලදී ගත් වර්ෂය 1995 |
| 8 | 1250සෙට්ස් | ඇලුමිනියම් ෆර්සිං ට්‍රේස් උඩ තැටිය සමග<br>නිෂ්පාදිත රට - සිංගප්පූරුව<br>මිලදී ගත් වර්ෂය - 1995 |
| 9. | 150 | ප්ලාස්ටික් රිඉන්ෆෝස්ඩ් ක්රේට්ස්<br>10' x 24' x 16'<br>නිෂ්පාදිත රට - සිංගප්පූරුව<br>මිළ දී ගත් වර්ෂය - 1995 |
| 10. | 650 | ප්ලාස්ටික් රිඉන්පෝස්ඩ් ක්රේට්ස්<br>13' x 182' x 26'<br>නිෂ්පාදිත රට - සිංගප්පූරුව<br>මිල දී ගත් වර්ෂය - 1995 |
| 11 | 01 | අයිස් ක්‍රෂර් මේක් - ස්පීඩ් ෆ්රිස්<br>මොඩ්ල් - එස්කේඑෆ් 01. 08.22<br>ධාරිතාව - 4 කි. ග්‍රෑ/පැය<br>නිෂ්පාදිත රට - සිංගප්පූරුව<br>මිල දී ගත් වර්ෂය - 1995 |
| 12. | 01 යුනිට් | පවර් ඩිස්ට්‍රිබියුෂන් සිස්ටම්<br>මේන් කන්ට්‍රෝල් පැනල්, සම් බෝර්ඩ්ස් ස්විච් පියර්<br>කේබල්ස් සවි කරන ලද අවුරුද්ද - 1994 |
| 13. | 01 යුනිට් | වෝටර් සප්ලයි සිස්ටම්<br>ජිනසේන පොම්ප 2 යි, විවර්හෙඩ් ටැන්ක්ස්<br>කන්ට්‍රෝල් පැනල් - පයිප්ප සහ ෆිටිංස් |
| 14. | 01 ලොට් | ටූල්ස්, උපාංග, අමතර කොටස්,<br>එක්ස්ට්‍රැක්ටර්ස් හේජස් ආදිය<br>මිලදී ගත් වර්ෂය - 1994 |

ඉහත සඳහන් යන්ත්‍ර සූත්‍ර 2009 පෙබරවාරි මස 17 වැනි දින පෙරවරු 10.30 ට එම යන්ත්‍ර සූත්‍ර තබා ඇති ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යන්ත්‍ර සූත්‍ර පිහිටා ඇත්තේ උස්වැටකෙයියාව පල්ලියේ සිට කි. මී. 1.4 ක් ගිය විට හමුවන ස්රීමික් සී ෆූඩ්ස් ප්‍රයිවෙට් ලිමිටඩ් ආයතනය තුළය. අංක 357/1, පරණ අම්බලම, උස්වැටකෙයියාව.

**හතරවන වෙන්දේසියේ විකිණීම**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළේ, දකුණ රාගම් පත්තුවේ, ජාඇල ප්‍රාදේශීය සභා සීමාව තුළ දැලතුර පිහිටි බලයලත් මිනින්දෝරු ගාමිණී බී. දොඩන්වෙල විසින් සාදන ලද 2008 සැප්තැම්බර් 8 දිනැති අංක 7311 දරන සැලැස්මේ සඳහන් හුන්ගන්වට කුඹුර සහ වැලිහිදේකුඹුර, හුන්ගන්වෙල කුඹුර නමින් ද හඳුන්වනු ලබන ඉඩමේ ලොට් 3 ඒ 1 ලකුණු කල (බලයලත් මිනින්දෝරු සහ තලමිතිකරු එම්. ඩී. ජේ. ඩී. පෙරේරා විසින් සාදන ලද 1971 අගෝස්තු 22 දිනැති අංක 2884 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ලොට් 3ඒ හි ඉතිරි කොටසෙහි කොටසක්) බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස, රූඩ් එකයි, පර්චස් තිස් එකයි දශම අටයි හයක් (අ. 0, රූ. 1, පර්. 31.86) (හෙක්ටයාර 0.1817) විශාල, එහි පිහිටි සියලු දේ සමග ඉඩම.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළේ, දකුණ රාගම් පත්තුවේ, ජාඇල ප්‍රාදේශීය සභා සීමාව තුළ දැලතුර පිහිටි බලයලත් මිනින්දෝරු ගාමිණී ඩී. දොඩන්වල විසින් සාදන ලද 2008 සැප්තැම්බර් මස 08 වැනි දිනැති අංක 7311 දරන සැලැස්මේ සඳහන් හුන්ගන්වටකුඹුර සහ වැලිහිදේකුඹුර, හුන්නන්වෙල කුඹුර නමින් ද හඳුන්වනු ලබන ඉඩමේ ලොට් 3ඒ2 ලකුණු කල (බලයලත් මිනින්දෝරු සහ තලමිතිකරු එම්. ඩී. ජේ. පෙරේරා විසින් සාදන ලද 1971 අගෝස්තු මස 22 වැනි දිනැති අංක 2884 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ලොට් 3ඒ හි ඉතිරි කොටසෙහි කොටසක්) බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස, අක්කර එකයි, පර්චස් විසි එකයි දශම හයයි දෙකක්) (අ. 1. රූ. 0, පර්. 21.62) (හෙක්ටයාර් 0.4594) විශාල එහි පිහිටි සියලු දේ සමග ඉඩම.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළේ, දකුණ රාගම් පත්තුවේ, ජාඇල ප්‍රාදේශීය සභා සීමාව තුළ දැලතුර පිහිටි බලයලත් මිනින්දෝරු ගාමිණී බී. දොඩන්වල විසින් සාදන ලද 2008 සැප්තැම්බර් මස 08 දිනැති අංක 7311 දරන සැලැස්මේ සඳහන් හුන්ගන්වට කුඹුර සහ වැලිහිදේකුඹුර, හුන්ගන්වෙල කුඹුර නමින් ද හඳුන්වනු ලබන ඉඩමේ ලොට් 3 බී 1 ලකුණු කල (බලයලත් මිනින්දෝරු සහ තලමිතිකරු එම්. ඩී. ජේ. වී. පෙරේරා විසින් සාදන ලද 1971 අගෝස්තු මස 22 දිනැති අංක 2884 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ලොට් 3බී හි ඉතිරි කොටසෙහි කොටසක්) බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස, රූඩ් තුනයි, පර්චස් හතයි දශම බිංදුවයි හයක් (අ. 0, රූ. 3, පර්. 07.06) (හෙක්ටයාර 0.3214) විශාල, එහි පිහිටි සියලු දේ සමග ඉඩම.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළේ, දකුණ රාගම් පත්තුවේ, ජාඇල ප්‍රාදේශීය සභා සීමාව තුළ දැලතුර පිහිටි බලයලත් මිනින්දෝරු ගාමිණී බී. දොඩන්වල විසින් සාදන ලද 2008 සැප්තැම්බර් මස 08 දිනැති අංක 7311 දරන සැලැස්මේ සඳහන් හුන්ගන්වට කුඹුර සහ වැලිහිඳේකුඹුර, හුන්ගන්වෙල කුඹුර නමින් ද හඳුන්වනු ලබන ඉඩමේ ලොට් 3 බී 2 ලකුණු කල (බලයලත් මිනින්දෝරු සහ තලම්තිකරු එම්. ඩී. ජේ. ඩී. පෙරේරා විසින් සාදන ලද 1971 අගෝස්තු මස 22 දිනැති අංක 2884 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ලොට් 3බී ඉතිරි කොටසෙහි කොටසක්) බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස, අක්කර එකයි, පර්චස් නමයයි දශම එකක් (අ. 1, රූ. 0, පර්. 09.21) (හෙක්ටයාර 0.4280) විශාල, එහි පිහිටි සියලු දේ සමග ඉඩම.

පෙර කී විස්තර කරන ලද අංක 7311 දරන සැලැස්මේ සඳහන් ලොට් 3ඒ1, 3ඒ2, 3බී1 සහ 3බී2 ලකුණු කළ එකී ඉඩම් කැබලි පහත පිළිවෙලින් විස්තර කරනු ලබන බලයලත් මිනින්දෝරු එම්. ඩී. ජේ. වී. පෙරේරා විසින් සාදන ලද 1971.08.22 දිනැති අංක 2884 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ලොට් 3ඒ සහ ලොට් 3 බී හි ඉතිරි කොටසෙහි කොටස් වේ.

1. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළේ දකුණ රාගම් පත්තුවේ තාරාකුලිය වඩාත් නිවැරදිව දැලතුර පිහිටි බලයලත් මිනින්දෝරු එම්. ඩී. ජේ. වී. පෙරේරා විසින් සාදන ලද 1971.08.22 දිනැති අංක 2884 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන හුන්ගන්වෙල කුඹුර සහ වැලිහිඳ කුඹුර යනුවෙන් ද හඳුන්වනු ලබන හුන්ගන්වෙල සහ වැලිහිඳකුඹුර නමැති ඉඩම ලොට් 3ඒ ලකුණු කල බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස, අක්කර දෙකයි රූඩ් තුනයි පර්චස් දහසයයි දශම පහයි බිංදුවක් (අ. 2, රූ. 3, පර්. 16.50) විශාල, එහි පිහිටි සියලු දේ සමග ඉඩම. මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් බී 123/110 ඒ යටතේ ලියාපදිංචි කර ඇත.

2. පෙර කී තාරාකුලිය වඩාත් නිවැරදිව දැලතුර පිහිටි පෙර කී අංක 2884 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන හුන්ගන්වෙල කුඹුර සහ වැලිහිඳ කුඹුර යනුවෙන් ද හඳුන්වනු ලබන හුන්ගන්වෙල සහ වැලිහිඳකුඹුර නමැති ඉඩමේ ලොට් 3 බී ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස, අක්කර දෙකයි රූඩ් එකයි පර්චස් තිස් නවයයි දශම දෙකයි පහක් (අ. 2, රූ. 2, පර්. 39.25) විශාල, එහි පිහිටි සියලු දේ සමග ඉඩම. මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් බී 123/109 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත සඳහන් දේපල 2009 පෙබරවාරි මස 17 වැනි දින පෙරවරු 11.30 ට එම දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ඉඩමට පිවිසීම*.- කොළඹ සිට මීගමුව පාරේ සැතැප්ම 13 ක් ගිය විට හමුවන තුඩැල්ල හන්දියෙන් වමට ඇති පමුණුගම පාරේ හැතැප්ම 2/3 ක් ගිය විට සහ යෝජිත කොළඹ කටුනායක අධිවේගී මාර්ගය පසුකල වහාම දකුණට ඇති වැලිහිඳ පාරේ යාර 100 ක් ගිය විට දකුණු පස දේපල පිහිටා ඇත.

**පස්වන වෙන්දේසියේ විකිණීම**

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, කළුතර තොටමුණ කළුතර බැද්ද කාලමුල්ල පිහිටි බලයලත් මිනින්දෝරු එන්. ද එස්. වීරක්කොඩි විසින් සාදන ලද 1988.09.08 දිනැති අංක 2370 දරන සැලැස්මේ සඳහන් කහටගහවත්ත නමැති ඉඩමේ ලොට් බී ලකුණු කළ ඉඩම් කොටස, පර්චස් විසි අටයි දශම දෙකයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 28.20) විශාල එහි පිහිටි සියලු දේ සමග ඉඩම. මෙය කළුතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් පී 105/93 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත සඳහන් දේපල 2009 පෙබරවාරි මස 17 වැනි දින පස්වරු 3.30 ට එම දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ඉඩමට පිවිසීම*.- කළුතර ඔස්සේ කටුකුරුන්ද හන්දියේ සිට ගාලු පාර ඔස්සේ කලමුල්ල සාන්ත අන්තෝනි පල්ලිය පසුකර තවත් යාර 50-75 ක් ගාලු පාර දිගේ ගොස් වමට ඇති අඩි 10 ක් පළල පුද්ගලික පාරේ යාර කීපයක් ගිය විට අදාළ දේපල පිහිටා ඇත.

යෝජනා සම්මුති දැන්වීම *රජයේ ගැසට් පත්‍රයේ* 2008.11.21 වැනි දින පළ වී ඇති අතර, ලංකාදීප, ඩේලිමිරර් සහ වීරකේසරි පුවත්පත්වල 2008.11.06 වැනි දින පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය*.- සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවිම් කල යුතුය :-

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% ක් වන පළාත් අධිකාරි බද්ද (සියයට එකක්), 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්), 4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2000, 5. ලිපිකරු සහ සෝෂක වේතනය රු. 500, 6. සියලුම ප්‍රචාරක වියදම් ද ගැණුම් මිලෙන් ඉතිරි 90% ද විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත සෙලාන් බැංකුව පීඑල්සී වෙත ගෙවා නිම කල යුතුය.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න : සහකාර සාමාන්‍යාධිකාරී (නීති), සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03. දුරකථන අංක : 011-2456285, 2456263, 2456284.

තුසිත කරුණාරත්න, (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස්.

ටී. ඇන්ඩ්. එච්. ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත, කොලොන්නාව.
දුරකථන අංක : 011-2696155, 011-2572940

01-658

---

**පෑන් ඒෂියා බැන්කින් කෝපරේෂන් පීඑල්සී**

වටිනා දේපලක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙහි 4 වන වගන්තිය යටතේ විකිණීම

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයෙහි, සල්පිටි කෝරළේ, පල්ලේපත්තුවේ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ නගර සභා සීමාවන් ඇතුළත, නාවල පිහිටි, නාවල පාරෙහි, දැනට වරිපනම් අංක 445 දරන, මිල්ලගහවත්ත නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු එම්. එල්. එන්. පෙරේරා මහතා විසින් සකසන ලද, 2006 මැයි මස 28 වැනි දින දාතමින් යුතු, පිඹුරුපත් අංක 3551 හි ලොට් අංක 18 ලෙස නිරූපිත බෙදා වෙන් කරන ලද ඉඩම. (මෙම ඉඩම බලයලත් මිනින්දෝරු සිරි. ඩී ලියනසූරිය මහතා විසින් සකසන ලද 1982 ඔක්තෝබර් මස 29 වැනි දින දරන පිඹුරුපත්

අංක 2639 හි ලොට් අංක 18 ලෙස සඳහන් ඉඩමේ නැවත මැනීමක් වන අතර, එම අංක 2639 දරන පිඹුරුපතේ ලොට් අංක 18 වන ඉඩම් කොටස බලයලත් මිනින්දෝරු එස්. කුමාරස්වාමි මහතා විසින් සකසන ලද 1959 අප්‍රේල් මස 24 වැනි දින දරන පිඹුරු පත් අංක 127 හි ලොට් අංක 18 හි නැවත මැනීමකි).

ඉඩමේ ප්‍රමාණය අක්. 0, රූ. 0, පර්. 20 එහි පිහිටි ගොඩනැගිලි සහ සියල්ල සහිතව ද අංක 127 දරන පිඹුරු පතෙහි ලොට් අංක 20 හි දැක්වෙන පාරෙහි මාර්ග අයිතිය ද සමග.

*ඉඩමට පිවිසෙන ආකාරය.-* මෙම ඉඩමට නාවල මංසන්ධියේ සිට පිවිසීමට (නාවල පාර හා නාරහේන්පිට පාර සම්බන්ධ වන ප්‍රධාන මංසන්ධිය) නාවල පාර ඔස්සේ රාජගිරිය දෙසට කිලෝමීටර 1.2 පමණ ගමන් කරන විට ඔබගේ වම් පසෙහි මෙම ඉඩම පිහිටා ඇත.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජේ. ආර්. දොලවත්තගේ විසින් සහතික කරන ලද, 2006 දෙසැම්බර් මස 28 දිනැති, අංක 2257 දරන උකස්කරය සහ අංක 2259 දරන උකස්කරය ප්‍රකාර, ඔටෝවේ එන්ටර්ප්‍රයිසස් (පුද්ගලික) පැන් ඒෂියා බැන්කින් කෝපරේෂන් පීඑල්සී (කලින් පැන් ඒෂියා බැන්ක් ලිමිටඩ් හා පැන් ඒෂියා බැන්කින් කෝපරේෂන් ලිමිටඩ් ලෙස හඳුන්වනු ලැබූ) ට උකස් කරන ලදුව, බැදුම්කරු විසින් ගෙවීම් ඉටු කර නැත.

පැන් ඒෂියා බැන්කින් කෝපරේෂන් පීඑල්සී විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින් 2009 පෙබරවාරි මස 12 වෙනි දින (බ්‍රහස්පතින්දා) පෙරවරු 11.00 ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය.-* මිල තීන්දු වූ වහා ම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතුය.

1. ගැනුම් මිලෙන් 10 %ක් ;
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක විකුණුම් බදු ;
3. ගැනුම් මිල මත වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2 ( 2 1/2 ක් පමණ) ;
4. රු. 90,000.00 කට අඩු වන සම්පූර්ණ ප්‍රචාරක පිරිවැයෙන් 50% ක් ;
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500.00 ;
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2000.00.

ගැනුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීම සඳහා කරුණාකර 2008 ජූලි මස 04 වැනි දින සිලෝන් ඩේලි නිවුස්, ලක්බිම, සුඩර් ඔලි පුවත්පත් ද 2008 ජූලි මස 18 වැනි දින *රජයේ ගැසට් පත්‍රය*ද බලන්න.

වැඩි විස්තර හා ඔප්පුව පිළිබඳ ලියකියවිලි, ජ්‍යෙෂ්ඨ කළමනාකරු, නීති අංශය, පැන් ඒෂියා බැන්කින් කෝපරේෂන් PLC, 450, ගාලුපාර, කොළඹ 03 යන ලිපිනයෙන් පරීක්ෂා කර බැලීමට හා ලබා ගැනීමට හැකිය. දුරකථන අංක 2565573, 2565565.

ෂොක්මන් සහ සමරවික්‍රම

රජයේ අනුමත හා එකම ISO 9001:2000 සහතිකය ලත්, ශ්‍රී ලංකාවේ ප්‍රසිද්ධ, පුරෝගාමී වරලත් වෙන්දේසිකරුවෝ, උපදේශක තක්සේරුකරුවෝ සහ ඉඩම් අලෙවි නියෝජිතයෝ.

*ප්‍රධාන කාර්යාලය,*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර,
දුරකථන : 081-2227593
දුරකථන/ෆැක්ස් : 081-2224371
ඊමේල් :schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය හා ප්‍රදර්ශනාගාරය,*
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 05,
දුරකථන : 011-2502680, 2585408
දුරකථන/ෆැක්ස් : 011-2588176
ඊමේල් :schokman@samera1892.com.

වෙබ් අඩවිය :www.schokmandsamerawickreme.com.

01-620

---

## රුහුණ සංවර්ධන බැංකුව – මොරවක ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

රුහුණ සංවර්ධන බැංකුවෙන් මා වෙත පවරන ලද බලය මත මෙහි පහත විස්තර වන දේපළ 2009.02.11 දින පෙ.ව. 11.30 ට එම දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

### දේපළ පිළිබඳ විස්තරය

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මොරවක් කෝරළේ, වැලිවේ, පිහිටි පොල්ගස්විල හේන නමැති අක්කර පහයි, රූඩ් එකයි, පර්චස් විසිහතරක් (අක්. 05, රූඩ් 01, පර්. 24) ක් විශාල ඉඩම සහ එහි පිහිටි සියලු ගහකොළ, පළතුරු හා ගොඩනැගිලි ද වේ. ඉහත කී දේපළ අයි. කොටඹගේ බලයලත් මිනින්දෝරු මහතා සකස් කළ අංක 4421 හා 2002.11.09 වැනි දිනැති පිඹුරේ නිරූපනය වේ.

වැඩි විස්තර සඳහා 2008.10.24 වැනි දින *රජයේ ගැසට් පත්‍රය*ද 2008.12.03 දින දිනමිණ, තිනකරන්, හා ද අයිලන්ඩ් යන පුවත්පත්වලද පළ කර ඇති වෙන්දේසි යෝජනාවට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම.-*මොරවක ප්‍රාථමික පාසල අසළින් වැටී ඇති මිල්ලව පාරේ කි. මී. 1 1/2 ක් පමණ ගිය විට පාරට මායිම්ව පාරේ දකුණු පස වමට දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසිය තීන්දු කළ විගස පහත සඳහන් මුදල් ගැනුම්කරු විසින් මුදලින් ගෙවිය යුතුය.

01. ගැනුම් මිලෙන් 25% ක් ද ;
02. පළාත් අධිකාරියේ බදු සඳහා විකුණුම් මිලෙන් 1% ක්ද ;
03. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% ක්ද ;

04. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500 ක් ද ;
05. විකුණුම් වියදම් සහ වෙනත් ගාස්තු ඇතොත් එම මුදලද ;
06. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු ද වේ.

ගැණුම් මිලෙන් ඉතිරි 75% ක් වූ මුදල වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත මාතර, පඹුරන, අනගාරික ධර්මපාල මාවතේ අංක 382 ඒ, දරන ස්ථානයේ පිහිටි රුහුණ සංවර්ධන බැංකුවේ, ප්‍රධාන කාර්යාලයේ සාමාන්‍යාධිකාරිතුමාට ගෙවිය යුතුය.

ඉහත සඳහන් පරිදි දින 30 ක් ඇතුළත අදාළ මුදල නොගෙවුවහොත් දැනටමත් ගැනුම් මිලෙන් ගෙවා ඇති 25% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබා ගත හැක.

දුරකථන අංක 041-2231532, 2226208, 2226209, 041-2282523

පී. පී. ආනන්ද,
සාමවිනිසුරු, බලයලත් වෙන්දේසිකරු,
උසාවි කොමසාරිස් හා තක්සේරුකරු.

කුරුඳුවත්ත, වල්ගම, මාතර,
දුරකථන අංකය : 041-2228731, 071-4438516

01-536

---

## ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

මීගමුව දිසා අධිකරණයේ දී ය.

හිරිපිටියගේ ඉන්දුලතා ඇග්නස්,
'සුනිල් සෙවන',
කනත්ත පාර, මාදුව,
කටුනායක.

නඩු අංකය
එම්බී/3395/06
ස්වභාවය : උකස් බැඳුම්කර

පැමිණිලිකාරිය..................................

.........................එදිරිව

මැල්ලව තන්ත්‍රිගේ රණසිංහ පෙරේරා,
අංක : 59, සුමිත්‍රාරාම,
පන්සල පාර, ඇවරිවත්ත,
කටුනායක.

විත්තිකරු..................................

මීගමුව දිසා අධිකරණයේ අංක එම්.බී./3395/06 දරන නඩුවේ වර්ෂ 2008.06.02 වැනි දින ඇතුළත් කර ඇති තීන්දු ප්‍රකාශය අනුව, ඉහත නම් සඳහන් විත්තිකරුගෙන් පැමිණිලිකරුට අයවිය යුතු බවට තීන්දු කර ඇති විත්තිකරු විසින් පැමිණිලිකාරියට ගෙවිය යුතුව තිබෙන රුපියල් දෙලක්ෂ හැටදහස (2,60,000) ක මුදලක්ද, නඩු ගාස්තුද, ගෙවිය යුතු බවට තීන්දු ප්‍රකාශ කර ඇති අතර, ඉහත විත්තිකරු විසින් එකී මුදල් ගෙවීමට අපොහොසත් වී ඇති බැවින්, එකී මුදල් අයකර ගැනීම සඳහා පහත උපලේඛනයේ විස්තර කරන නිශ්චල දේපළ වෙන්දේසිකර, එම මුදල් අයකර දීම සඳහා මීගමුව දිසා අධිකරණයේ ඉහත අංක දරන නඩුවෙන් මා වෙත ඉදිරිපත් කර ඇති, විකිණීමේ ආඥාව ප්‍රකාරව එකී නිශ්චල දේපළ වර්ෂ 2009 ක් වූ පෙබරවාරි මස 21 වැනි දින පෙ.ව. 10.00 ට එකී දේපළ පිහිටි අංක 59, සුමිත්‍රාරාම පන්සල පාර, ඇවරිවත්ත, කටුනායක දරන ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් ප්‍රසිද්ධ කොට ප්‍රකාශ කරනු ලැබේ.

එකී වෙන්දේසියේදී ඉහළම ලංසු තබන්නා ගැනුම්කරු වන අතර, වෙන්දේසිය අවසන් වූ වහාම ගැනුම්කරු විසින්, මුළු ගැනුම් මිලෙන් 25% ක මුදලක් ද, තක්සේරු ගාස්තු, වෙන්දේසිය ගැසට් පත්‍රයේ සහ පුවත්පත්වල ප්‍රසිද්ධ කිරීමේ වියදම්ද, අනෙකුත් ප්‍රචාරක කටයුතු සඳහා වූ වියදම්ද, වෙන්දේසිකරුගේ කොමිස් මුදලද, පළාත් පාලන ආයතන සඳහා ගෙවිය යුතු ගාස්තුද, මෙම කොන්දේසි සහතික කිරීම සඳහා වූ සියලු වියදම්ද, ගැනුම්කරු විසින් ඒ අවස්ථාවේදීම මුදලින් මා වෙත ගෙවිය යුතුය. චෙක්පත් භාරගනු නොලැබේ. ගැනුම් මිලෙන් ඉතිරි 75% ක මුදල දින තිහක් (30%) ඇතුළත මීගමුව දිසා අධිකරණයේ ඉහත අංක දරන නඩුවට තැන්පත් කළ යුතුය.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ අලුත්කුරු කෝරළේ දාසිය පත්තුවේ කටුනායක සීදුව නගර සභා සීමාව තුළ කොට්ඨාස අංක 11 ට අයත් හල්ගස්තොට බේස්ලයින් පාරේ පිහිටා ඇති වරිපනම් අංක 55 දරන සියඹලාගහවත්ත සහ දවටගහඹිවිට නමැති ඉඩම් කොටස් දෙකක් එක්බැඳි ඉඩමට එච්. එල්. කෘෘස් දබරේරා බලයලත් මිනින්දෝරු තැන විසින් මැන සාදන ලද අංක : 4606/1986 සහ 1986.04.22 වැනි දිනත් දරන පිඹුරේ කැබලි අක්ෂර පී සහ කැබලි අක්ෂර කිව් යනුවෙන් ඉඩම් කොටස් දෙකක් එක්බැඳිඉඩම, උතුරට : ගම්සභා පාරද, නැගෙනහිරට : මෙම ඉඩමේ කැබලි අංක 2 ඒ දරන කොටස ද, දකුණට සහ දකුණු බස්නාහිරට සහ බස්නාහිරටත් : මෙම ඉඩමේ කැබලි අංක 2 බී දරන කොටස ද, මායිම් වූ පර්චස් දාහතර (අක්. 0, රූඩ් 0, පර්. 14) ක් විශාල ඉඩම් කොටස සහ ඊට අයිති ගසකොළ පළතුරු ගොඩනැගිලි ආදී සියලු දේත් වේ.

*දේපළට පිවිසීම*.- යාගොඩමුල්ල ඇවරිවත්ත පාරේ පැමිණ, ඇවරිවත්ත හන්දියෙන් වමට හැරී අමන්දොළුව සීදුව පාරේ පැමිණ, හල්ගස්තොට හන්දියෙන් වමට හැරී සුමිත්‍රාරාම පන්සල පාරේ මීටර් 200 ක් පමණ පැමිණිවිට විකිණීමට ඇති ඉඩම සහ නිවස හමුවේ.

වැඩි විස්තර සඳහා මීගමුව දිසා අධිකරණයේ නීතිඥ තුෂාරි ගුණවර්ධන මහත්මිය, ආඩි අම්බලම.

අයි. සී. ඒ. පෙරේරා,
උසාවි කොමසාරිස්,
වෙන්දේසිකරු හා තක්සේරුකරු.

01-529

### මහජන බැංකුව - ගාල්ල මහවිදිය ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය මත 2009.02.12 වැනි දින පෙ.ව . 10.30 ට මෙහි පහත විස්තර වන දේපොළ එකී දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

#### උකස්කර ඇති දේපළ පිළිබඳ විස්තරය

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාලු කඩවත් සතර තුළ මහ නගර සභා සීමාවේ, දන්ගෙදර ඕල්කට් මාවත පිහිටි වරිපනම් අංක 97 දරන උළුගෙදරවත්ත නොහොත් කුඩාඋලුගෙදරවත්ත නොහොත් බෙලිගස්වත්ත නැමැති ඉඩමේ 'කේ' අක්ෂරය දරන කැබැල්ලෙන් බෙදා වෙන් කළ 'කේ 01' දරන රූඩ් දෙකයි පර්චස් තිහයි දශම හයක් (අ. 0 රූ. 2 පර්. 30.6) විශාල ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි වැව්ලි ආදී සියලු දේ ද වේ.

වැඩි විස්තර සඳහා 2007.10.05 දින *රජයේ ගැසට් පත්‍රයේ* ද 2007.09.21 දින දිනමිණ ඩේලිනිව්ස් හා තිනකරන් යන පුවත්පත්වල පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමුකරන්න.

*දේපළට පිවිසෙන මාර්ගය.*- ගාල්ල ඕල්කට් මාවතේ මීටර් 150ක් ගමන් කරන විට වමට ඇති මාර්ගයේ මෙම කම්හල පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - සාර්ථක ගැනුම්කරු විසින් වෙන්දේසිය අවසානයේ පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

01. ගැනුම් මිලෙන් 10%ක් ද ;
02. පළාත් අධිකාරියේ බදු සඳහා විකුණුම් මිලෙන් 1%ක් ද ;
03. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් ගැනුම් මිලෙන් 2 1/2%ක් ද ;
04. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500ක් ද.
05. විකුණුම් වියදම හා වෙනත් ගාස්තු ඇතොත් එම මුදල ද :
06. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු වේ.

ගැනුම් මිලෙන් ඉතිරි 90%ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත ගාල්ල පහළ ඩික්සන් පාරේ අංක 22 දරන ස්ථානයේ පිහිටි මහජන බැංකුව ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ ප්‍රාදේශීය කළමනාකාර මහතාට ගෙවිය යුතුය.

දුරකථන අංක : 091-2232311, 2234785, 2234171, 2223564
ෆැක්ස් අංකය : 091-2232230.

හිමිකම් ඔප්පු හා වෙනත් අදාළ විස්තර ඉහත ලිපිනයෙන් ලබාගත හැක.

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගැනුම් මිලෙන් ගෙවා ඇති 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ජී. පී. ආනන්ද (සාමවිනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
උසාවි කොමසාරිස් හා තක්සේරුකරු.

කුරුඳුවත්ත,
වල්ගම, මාතර.
දුරකථන අංකය : 041- 2228731.

01-673